# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 82 — 1973 ඔක්තෝබර් 19 වැනි සිකුරාදා — 1973.10.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස — පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 1021 | ආදායම හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | 1026 | අය-වැය ලේඛන ... ... | 1035 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 1030 | මාර්ග කොමිටි දැන්වීම ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — | විවිධ දැන්වීම ... ... | 1040 |


**සැලකිය යුතුයි.**—ධීවර (සංශෝධන) පනත් කෙටුම්පත, දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත සහ ලොරි බලකර ලබා ගැනීම හා අත්කර ගැනීම පනත් කෙටුම්පත 1973 ඔක්තෝබර් 12 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

## පළාත් පාලන නිවේදන

### ගම්සභා ආඥාපනත

#### ආඥාව

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5 සහ 10 වැනි වගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු වැඩබලන අමාත්‍ය විලියම් නීල් ද අල්විස් වන මම මෙම ආඥාවෙන්—

(1) කෑගලු දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරළේ එගොඩපත්තු ගම් ප්‍රදේශය මෙහි උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කෙරෙන අම්තිරිගල හා ඉඹුලාන යන නව ගම් ප්‍රදේශ දෙකකට බෙදා වෙන් කරමි; තවද

(2) ඉහත කී අම්තිරිගල හා ඉඹුලාන යන එක් එක් ගම් ප්‍රදේශය සඳහා සංස්ථාපනය කිරීමට නියමිත ගම්සභාවන්හි නිලකාලය ආරම්භ වන දිනය වශයෙන් 1974 ජූලි මස පළමු වැනි දිනය ලෙස නියම කරමි.

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු වැඩබලන අමාත්‍ය.

1973.09.24 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

පහත සඳහන් ග්‍රාම සේවක කොට්ඨාශවලින් සමන්විත අම්තිරිගල ගම් ප්‍රදේශය :—

අංක 101ඒ ඉඳුරාන,

අංක 102 අම්තිරිගල,

අංක 103 මාපිටිගම දකුණ,

අංක 103ඒ මාපිටිගම උතුර,

අංක 098 වල්ගම්පත ග්‍රාම සේවක කොට්ඨාශයේ බස්නාගොඩ, ලෙනගල, ඔහකන්ද ජනපදය යන ගම්වලින් හා වින්සිටි වත්තේ කොටසකින් හා මාගල්කන්ද වත්තේ කොටසක්,

අංක 101 වහරක ග්‍රාම සේවක කොට්ඨාශයේ වහරක ගමෙන් හා මඩොල්තැන්නවත්ත, වින්සිටි වත්තේ කොටසකින් හා මාගල් කන්ද වත්තේ කොටසක්.

පහත සඳහන් ග්‍රාම සේවක කොට්ඨාශවලින් සමන්විත ඉඹුලාන ගම් ප්‍රදේශය :—

අංක 99 ලෙවන්ගම,

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමණ හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1973 ජනවාරි මස 7 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

අංක 99ඒ ගලපිටමඩ,

අංක 100 ඉඹුලාන (රුවන්වැල්ල සුළු නගර සභා ප්‍රදේශයෙන් පිටස්තරව පිහිටි කොටස පමණි),

අංක 104 බෝපැත්ත (රුවන්වැල්ල සුළු නගර සභා ප්‍රදේශයෙන් පිටස්තරව පිහිටි කොටස පමණි),

අංක 98 වල්ගම්පත ග්‍රාම සේවක කොට්ඨාශයේ වල්ගම්පත ගමින් හා දුනුමාල වත්තේ කොටසක්,

අංක 101 වහරක ග්‍රාම සේවක කොට්ඨාශයේ මොරතොට, වැද්දාවල හා පොත්තෙකන්ද ජනපදය යන ගම්වලින් සහ සනික්‍රොෆ්ට් වත්ත, ආවිසන් වත්ත හා වැද්දුවල වත්ත යන වතු.

10–755/1—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 8 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු වැඩබලන අමාත්‍ය විලියම් නීල් ද අල්විස් වන මම, මෙම නිවේදනයෙන්—

(1) සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරළේ සහ පාත බුලත්ගම ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ "අම්තිරිගල" ගම් ප්‍රදේශයේ පිහිටි මෙහි වූ පළමුවැනි උපලේඛනයේ I තීරයේ සඳහන් දැනට පවත්නා එක් එක් ඡන්ද කොට්ඨාශය එකී උපලේඛනයේ II තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් සීමාවන් සහිතව නව ඡන්ද කොට්ඨාශවලට අනු කොටස් කර බෙදමි.

(2) සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරළේ සහ පාත බුලත්ගම ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ 'ඉඹුලාන' ගම් ප්‍රදේශයේ පිහිටි මෙහි වූ දෙවෙනි උපලේඛනයේ I තීරයේ සඳහන් දැනට පවත්නා එක් එක් ඡන්ද කොට්ඨාශය සහ එවැනි කොට්ඨාශයන්හි ඒකාබද්ධ ප්‍රදේශය එකී උපලේඛනයේ II තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් සීමාවන් සහිත වූ නව ඡන්ද කොට්ඨාශවලට අනු කොටස් කර බෙදමි.

(3) (1) සහ (2) ඡේදයන්හි විධිවිධාන—

(අ) ඒවා 1974 වර්ෂයේ පැවැත්වීමට නියමිත ඉහත කී එක් එක් ගම් ප්‍රදේශයේ ගම්සභාවට සභිකයන් තෝරා පත්කර ගැනීමේ මහා ඡන්ද විමසීමට සම්බන්ධ වූ යම් කරුණකට අදාළ වන ප්‍රමාණයට මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක විය යුතු යයි ද; තවද

(ආ) ඒවා වෙන යම් කරුණකට අදාළවන ප්‍රමාණයට 1974 ජූලි මස 1 වන දින සිට ක්‍රියාත්මක විය යුතු යයි ද;

ප්‍රකාශ කරමි.

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු වැඩබලන අමාත්‍ය.

1973. 09. 24 වැනි දින,
කොළඹ දී ය.

### පළමුවන උපලේඛනය

### අම්තිරිගල ගම් ප්‍රදේශය

| I වැනි තීරය | II වැනි තීරය |
|---|---|
| අංක 98—වල්ගම්පත | අංක 1 දරණ ඡන්ද කොට්ඨාශය, මහකන්ද :— මහකන්ද ජනපදය යන ගමෙන් සමන්විතය. |
| | අංක 2 දරණ ඡන්ද කොට්ඨාශය, බස්නාගොඩ :— බස්නාගොඩ ලෙනගල යන ගම්වලින් සහ මාගල්කන්ද වත්තේ වල්ගම්පත ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් කොටසින් ද, වින්සිව් වත්තේ වල්ගම්පත ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් කොටසින් ද සමන්විතය. |
| අංක 101—වහරක | අංක 3 දරන ඡන්ද කොට්ඨාශය, වහරක :— වහරක ගමෙන් ද මඩොල්තැන්න වත්තෙන් ද මාගල්කන්ද වත්තේ වහරක ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් කොටසින් හා වින්සිව් වත්තේ වහරක ග්‍රාම සේවක කොට්ඨාශයට අයත් කොටසින් ද සමන්විතය. |
| අංක 101ඒ—ඉඳුරාන | අංක 4 දරන ඡන්ද කොට්ඨාශය, ගෝනගල්දෙනිය :— ගෝනගල්දෙනිය නගරය හා පුරන්පොත්ත ගමෙන් ද, උතුරු සනික්‍රොෆ්ට් වත්තෙන් හා ධනලෙච්චමී වත්තේ ඉඳුරාන ග්‍රාම සේවක කොට්ඨාශයට අයත් කොටසින් ද සමන්විතය. |
| | අංක 5 දරන ඡන්ද කොට්ඨාශය, වහකුල :— වහකුල, දළුවලාන යන ගම්වලින් ද ස්ටින්ෆෝර්ඩ් වත්තෙන් සහ ඉඳුරාන වත්තේ ඉඳුරාන ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් කොටසින් ද සමන්විතය. |
| | අංක 6 දරන ඡන්ද කොට්ඨාශය, ඉඳුරාන :— ඉඳුරාන ගමෙන් හා චෙස්ටර්ෆෝඩ් වත්තෙන් සමන්විතය. |
| අංක 102—අම්තිරිගල | අංක 7 දරන ඡන්ද කොට්ඨාශය, බටුවිට :— බටුවිට ගමෙන් ද උතුරු අම්තිරිගල ගමේ මොරගහ ඇල්ල, ගොරකහේන්දොලෙන් උතුරට පිහිටි කොටසින් ද ධනලෙච්චමී වත්තේ අම්තිරිගල ග්‍රාම සේවක කොට්ඨාශයට අයත් කොටසින් ද සමන්විතය. |
| | අංක 8 දරන ඡන්ද කොට්ඨාසය, උතුරු අම්තිරිගල :— උතුරු අම්තිරිගල ගමේ මොරගහ ඇල්ල-ගොරකහේන් දොලෙන් දකුණට පිහිටි කොටසින් ද සමන්විතය. |
| | අංක 9 දරන ඡන්ද කොට්ඨාශය, දකුණු අම්තිරිගල :—දකුණු අම්තිරිගල ගමෙන් ද ක්‍රෝශිපාක් වත්ත සහ ලින්ඩ්හර්ස්ට් වත්ත යන වතු වලින් ද සමන්විතය. |
| | අංක 10 දරන ඡන්ද කොට්ඨාශය, උඩකණුගල :— උඩකණුගල, දෙහිඹිවිට යන ගම් වලින් ද මාපිටිගම වත්ත සහ චූව්කැන්හැම් වත්ත යන වතු වලින් ද සමන්විතය. |
| අංක 103—මාපිටිගම දකුණ | අංක 11 දරන ඡන්ද කොට්ඨාශය, පල්ලේ කණුගල :— පල්ලේ කණුගල ගමෙන් සහ ග්ලැන්ඇස්ක් වත්තෙන් සමන්විතය. |
| | අංක 12 දරන ඡන්ද කොට්ඨාශය, මැදගොඩ :—මැදගොඩ, මෙගොඩ කුඩ ගම යන ගම්වලින් ද ක්ලේරා වත්තෙන් ද සමන්විතය. |
| අංක 103 ඒ—මාපිටිගම උතුර | අංක 13 දරන ඡන්ද කොට්ඨාශය, දකුණු ගෝනගල :— දකුණු ගෝනගල ගමෙන් ද සිසිල්වත් වත්ත සහ චිල්ස්හර්ෂ්ට් වත්ත යන වතුවලින් ද සමන්විතය. |
| | අංක 14 දරන ඡන්ද කොට්ඨාශය, උතුරු ගෝනගල :— ගෝනගල ගමෙන් සහ ගෝනගල (ඉඳුරාන) වත්තේ මාපිටිගම උතුර ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් කොටසින් ද සමන්විතය. |
| | අංක 15 දරන ඡන්ද කොට්ඨාශය, මොරලිය :— මොරලිය, මාපිටිගම යන ගම්වලින් හා මොරලිය වත්තේ මාපිටිගම උතුර ග්‍රාම සේවක කොට්ඨාශයට අයත් කොටසින් ද සමන්විතය. |

දෙවන උපලේඛනය

**ඉඹුලාන ගම්ප්‍රදේශය**

| I වැනි තීරය | II වැනි තීරය |
|---|---|
| අංක 98—වල්ගම්පත | අංක 1 දරන ඡන්ද කොට්ඨාශය, වල්ගම්පත :—වල්ගම්පත ගම සහ දුනු මාලේ වත්තේ වල්ගම්පත ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් කෝටසින් ද සමන්විතය. |
| අංක 99ඒ—ගලපිටමඩ | අංක 2 දරන ඡන්ද කොට්ඨාශය, දුනුමාල :— දුනුමාල, කිත්ලන්ගමුව යන ගම්වලින් ද දුනුමාලේ වත්තේ ගලපිටමඩ ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් කොටසින් ද සමන්විතය. |
| | අංක 3 දරන ඡන්ද කොට්ඨාශය, ගලපිටමඩ :— ගලපිටමඩ, නගරය හා ගලපිටමඩ, කඩිගමුව සහ ඌරුවල යන ගම්වලින් සමන්විතය. |
| අංක 99—ලෙවන්ගම | අංක 4 දරන ඡන්ද කොට්ඨාශය, ඉඹුල්ගොඩ :—ඉඹුල්ගොඩ, ඉඹුල්ගොඩ ජනපදය, නාරගස්තැන්න යන ගම්වලින් ද ගලපිටමඩ වත්තෙන් ද සමන්විතය. |
| | අංක 5 දරන ඡන්ද කොට්ඨාශය, තලවත්ත :— තලවත්ත සහ දුම්බුලුව යන ගම්වලින් සමන්විතය. |
| අංක 99—ලෙවන්ගම | අංක 6 දරන ඡන්ද කොට්ඨාශය, උඩගම්මැද්ද :—උඩගම්මැද්ද, කොටලු ගොඩකන්ද, පහලගම යන ගම්වලින් ද ඉහළ අතලවවත්ත, පහළ අතලව වත්ත, මැදි කැල්ල, අතලවවත්ත සහ අක්කර දහයේ අතලවවත්ත යන වතුවලින් ද සමන්විතය. |
| අංක 100—ඉඹුලාන, අංක 104—බෝපැත්ත | අංක 7 දරන ඡන්ද කොට්ඨාශය, සියඹලාවල :—සියඹලාවල, බෙත්මෙ ගෙදර, ගැමඹුරුත යන ගම්වලින් ද පීටර්හිල් වත්තෙන් ද සමන්විතය. |
| | අංක 8 දරන ඡන්ද කොට්ඨාශය, නිවුන්හැල්ල :— නිවුන්හැල්ල ගමෙන් සමන්විතය. |
| | අංක 9 දරන ඡන්ද කොට්ඨාශය, ඉඹුලාන :—ඉඹුලාන ගමේ (රුවල්වැල් සුළු නගර සභා ප්‍රදේශයෙන් පිටස්තර පිහිටි) කොටසින් සහ කඩදර ගමෙන් සමන්විතය. |
| | අංක 10 දරන ඡන්ද කොට්ඨාශය. ඇරැපොලමුල්ල :— ඇරැපොලමුල්ල, බෝපැත්ත, බෝගමුව යන ගම්වලින් ද ඩෝවර් වත්තේ බෝපැත්ත ග්‍රාම සේවක කොට්ඨාශයට අයත් කොටසින් ද සමන්විතය. |
| | අංක 11 දරන ඡන්ද කොට්ඨාශය, මොරාවත්ත :— මොරාවත්ත ගමේ (රුවල්වැල්ල සුළු නගර සභා ප්‍රදේශයෙන් පිටස්තරව) දුම්බුලුව ඔයෙන් නැගෙනහිරට පිහිටි කොටසින් හා අකුරණ මුල්ල ගමෙන් සමන්විතය. |
| | අංක 12 දරන ඡන්ද කොට්ඨාශය, මාහල්ල :— මාහල්ල ගම හා මොරා වත්ත ගමේ දුම්බුලුව, ඔයෙන් බස්නාහිරට පිහිටි කොටසින් ද මාහල්ල වත්ත, වටාගලවත්ත, දඹුවත්ත, රුවල්වැල්ල වත්ත, ට්‍රෝසිවත්ත යන වතුවලින් හා මෝරලිය වත්තේ බෝපැත්ත ග්‍රාමසේවක කොටසට අයත් කොටසින් ද සමන්විතය. |
| | අංක 13 දරන ඡන්ද කොට්ඨාශය, දන්නොරුව :— දන්නොරුව, හුඹස්වලාන යන ගම්වලින් ද හුඹස්වලාන වත්තෙන් ද සමන්විතය. |
| | අංක 14 දරන ඡන්ද කොට්ඨාශය, රත්තාගල :— රත්තාගල, පොත්තෙ කන්ද යන ගම්වලින් ද පොත්තෙ කන්ද වත්තෙන් සහ ඩෝවර් වත්තේ ඉඹුලාන ග්‍රාමසේවක කොට්ඨාසයට අයත් කොටසින් ද සමන්විතය. |
| අංක 101 වහරක | අංක 15 දරන ඡන්ද කොට්ඨාශය, මොරතොට :—මොරතොට, පොත්තෙ කන්ද ජනපදය යන ගම්වලින් ද සනික්‍රොෆ්ට් වත්ත, ආට්සන් වත්ත සහ වැද්දාවල වත්ත යන වතුවලින් ද සමන්විතය. |

10–755/2—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

**ගම්සභා ආඥපනත**

ආඥාව

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 47 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව වැඩබලන රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති විලියම් නීල් ද අල්විස් වන මම එකී 47 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සාම්පල්තිව් ගම් ප්‍රදේශයේ ගම්සභාව සම්බන්ධයෙන් අදාල නොවිය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

නීල් ද අල්විස්,
වැඩබලන රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති.

1973 සැප්තැම්බර් මස 29 දින,
කොළඹ දීය.

10–739—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

ඇල්. ඩී.—බී. 70/44.

**නිවාස හා නගර සංවර්ධන ආඥාපනත**

1973. 08. 07 දින පැවැත්වුණු රැස්වීමකදී ජාතික රාජ්‍ය සභාව විසින් සම්මතකර ගන්නා ලද පහත සඳහන් යෝජනාව මහජනයාගේ දැනගැනීම පිණිස ප්‍රසිද්ධ කරනු ලැබේ.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973. 09. 27 දින,
කොළඹ දීය.

යෝජනාව

"(268 වැනි අධිකාරය වන) නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ උපලේඛනයේ විස්තර කෙරෙන ප්‍රදේශය ඇතුළත 1973. 08. 01 වැනි දින සිට එකී ආඥාපනත ක්‍රියාත්මක විය යුතු යයි එහි 3 (ආ) වැනි වගන්තියේ විධිවිධාන යටතේ මේ සභාව යෝජනා කරයි.

උපලේඛනය

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, යාපනය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසය, ඇතුළත්වූ නල්ලූර් ගම් සභාවේ පිහිටි, පහත සඳහන් අයුරින් මායිම් වූ මුළු බිම් කොටස :—

**කොට්ඨාස අංක 1—මුක්කුරුණි පිල්ලියාර් කෝවිල්.**

උතුරට : දකුණු කෝපායි ගම් සීමාව,

නැගෙනහිරට : යාපනය-පේදුරුතුඩු පාර,

දකුණට : අඩියපාදම් පාර,

බටහිරට : නාවක්කිරි පටුමග හා දකුණු කෝපායි ගම් සීමාව.

**කොට්ඨාස අංක 2—සී. එම්. එස්. පාසැල.**

උතුරට : දකුණු කෝපායි ගම් සීමාව,

නැගෙනහිරට : අඩියපාදම් පාරෙහි සිට නාව චෙම්මානි පාරට වැටෙන අයියන් ගවාදලි පටුමග,

දකුණට : අඩයපාදම් පාර,

බටහිරට : යාපනය-පේදුරුතුඩුව පාර.

**කොට්ඨාස අංක 3—සන් දාසේ ගරපිල් ලියාර් කෝවිල.**

උතුරට හා නැගෙනහිරට: දකුණු කෝපායි ගම් සීමාව,

දකුණට: අඩියපාදම් පාර,

බස්නාහිරට: අඩියපාදම් පාරෙහි සිට නව වෙම්මානි පාරට වැටෙන අයියන් ගවාදලි පටුමග.

**කොට්ඨාස අංක 4—පූනරයාර් කෝවිල.**

උතුරට: සන්තයාදි-මූදමාවඩි පටුමග, වලයිමාන් කෝවිලඩි පටුමග,

නැගෙනහිරට: යාපනය-පේදුරුතුඩුව පාර,

දකුණට: කොන්ඩලාඩි වෛරවාර් කෝවිල පාර,

බටහිරට: මූදමාවාඩි පාර.

**කොට්ඨාස අංක 5—වලෙයිඅම්මාන් කෝවිල.**

උතුරට: අඩියපාදම් පාර,

නැගෙනහිරට: යාපනය-පේදුරුතුඩුව පාර,

දකුණට: සාන්තයාඩි-වලෙයි අම්මාන් කෝවිල පටුමග,

බටහිරට: මූදමාවඩි පාර.

**කොට්ඨාස අංක 6—පර්ශයේ ෂණ ස්ථානය.**

උතුරට: කොන්ඩාවිල් ගම් සීමාව,

නැගෙනහිරට: නාවක් කිරි පටුමග,

දකුණට: අඩියපාදම් පාර,

බටහිරට: පලාලි පාර.

**කොට්ඨාස අංක 7—පරමේශ්වර විද්‍යාලය.**

උතුරට: අඩියපාදම් පාර,

නැගෙනහිරට: පලාලි පාර,

දකුණට: නාච්චිමාර් කෝවිල පාර,

බටහිරට: වන්නාර්පොන්නෙයි හා කොකුවිල් ගම් සීමාව.

**කොට්ඨාස අංක 8—නලංගම්පිල් ලියාර් කෝවිල.**

උතුරට: අඩියපාදම් පාර,

නැගෙනහිරට: කාලි කෝවිල පටුමග,

දකුණට: සිවන් කෝවිල පාර,

බටහිරට: පලාලි පාර.

**කොට්ඨාස අංක 9—මූදමාවඩි.**

උතුරට: අඩියපාදම් පාර හා කාලි කෝවිල පටුමග,

නැගෙනහිරට: මූදමාවඩි පාර,

දකුණට: සිවන් කෝවිල පාර,

බටහිරට: කාලි කෝවිල පටුමග.

**කොට්ඨාස අංක 10—සාර්ලිය පිඩ්ඩි.**

උතුරට: වෙම්මානි පාර,

නැගෙනහිරට: මහනුවර පාර.

දකුණට: අතික්කාඩු පටුමග,

බටහිරට: ආනන්දන් වාදලි පාර.

**කොට්ඨාස අංක 11—බටහිර අරියාලෙයි.**

උතුරට: මහනුවර පාර හා කලපුව,

නැගෙනහිරට: පුලියන් කුලම් පටුමග,

දකුණට: කලපුව,

බටහිරට: මුල් ලිව්ලවු ඔවන් ගායි හා මහනුවර පාර.

**කොට්ඨාස අංක 12—නැගෙනහිර අරියාලෙයි.**

උතුරට, නැගෙනහිරට, දකුණට: කලපුව.

බටහිරට: පුලියන් කුලම පටුමග.

10–740—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

## ගෝ ඝාතක ආඥාපනත

(272 වැනි අධිකාරය වන) ගෝ ඝාතක ආඥාපනතේ 27 වැනි වගන්තිය යටතේ නියමිත බලධරයා විසින් එනම්, බද්දේගම ගම්සභාව විසින්, සම්පාදිතව එකී වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්දේශ කටයුතු අමාත්‍යවරයා විසින් ස්ථිර කරණ ලද නියෝග.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 ඔක්තෝබර් 05 වැනි දින,
කොළඹ දීය.

### නියෝග

1. කිසිම තැනැත්තෙකු විසින් කිසිම සතෙකු—

(අ) ඒ සතා සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි තැන විසින් පරීක්ෂා කොට මිනිසුන්ගේ ආහාර පිනිස මරනු ලැබීමට සුදුසුයයි අනුමත කර තිබේනම් මිස; සහ

(ආ) මෙම නියෝගයේ (අ) ඡේදයේ යටතේ ඒ සතා මැරීමට අනුමත කරනු ලැබූ වේලාවෙන් පැය 24 ක කාලසීමාවක් ඉකුත්වී යාමෙන් පසුව යම් අවස්ථාවකදී; සහ

(ඇ) කිසියම් දිනක පූ. භා. 7 ටත් පූ. භා. 11 ටත් අතර කාලයේදී මිස; හෝ ගෝ ඝාතක ස්ථානයේදී නොමැරිය යුතුය.

එසේ වුවද විශේෂයයි තමා අදහස් කරන අවස්ථාවකදී මෙහි නිශ්චිතව සඳහන් වේලාවට වඩා වෙනස් වූ යම් වේලාවක යම් සතෙකු මැරීම සඳහා සභාපති විසින් බලය දිය හැකිය.

2. 1 වැනි නියෝගයේ (අ) ඡේදය යටතේ අනුමත කල සතෙකු ගෝඝාතක ස්ථානයට අයිති භූමියෙන් පණපිටින් ඉවත් කර ඇත්නම් ඒ සතා නැවතත් පරීක්ෂා කොට මිනිසුන්ගේ ආහාරය පිණිස මරනු ලැබීමට සුදුසුයයි එකී නියෝගය යටතේ අනුමත කරනු ලැබුවහොත් මිස කිසිම තැනැත්තෙකු විසින් ඒ සතා ගෝඝාතක ස්ථානයේදී නොමැරිය යුතුය.

3. (1) යම් සතෙකු 1 වැනි නියෝගයේ (අ) ඡේදය යටතේ මැරීමට සුදුසුයයි අනුමත කල පසු ඒ සතා ලෙඩ සහිත බව හෝ මිනිසුන්ගේ ආහාරය පිණිස මරනු ලැබීමට නුසුදුසු බව පෙනී ගියහොත් ඒ සතා මැරීම සෞඛ්‍ය වෛද්‍ය නිළධාරියා විසින් තහනම් කළ හැකිය.

(2) මෙම නියෝගයේ (1) ඡේදය යටතේ මැරීම තහනම් කරනු ලැබූ යම් සතෙකු කිසිම තැනැත්ත්තෙකු විසින් නොමැරිය යුතුය.

4. ගෝ ඝාතක ස්ථානයට යම් සතෙකු ගෙන එන සෑම තැනැත්තෙකු විසින්ම, ඒ සතා ගෝඝාතක ස්ථානයට අයිති භූමිභාගයෙහි නවත්වා සිටින කාලය තුළ ඒ සතාට සෑහෙන පරිදි කෑම බිම නිසැකවම ලැබීම සඳහා අවශ්‍ය සියළු විධිවිධාන යෙදිය යුතුය.

5. ගෝඝාතක ස්ථානයට යම් සතෙකු ගෙන එන සෑම තැනැත්තෙකු විසින්ම, ඒ සතා මරනු ලැබීමට සුදුසු නැතැයි ප්‍රතික්ෂේප කරන ලද්දේ නම්, එසේ ප්‍රතික්ෂේප කල වහාම ඒ සතා ගෝඝාතක ස්ථානය පිහිටි භූමි භාගයෙන් ඉවත් කළ යුතුය. නැතහොත් ඉවත් කිරීමට සැලැස්විය යුතුය.

6. ගෝඝාතක ස්ථානයේදී මරනු ලැබූ යම් සතෙකුගේ මස් හෝ මාංසාවශේෂ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරියාගේ මතය අනුව ලෙඩ සහිතව හෝ මිනිසුන්ගේ ආහාරයට නුසුදුසුව තිබේ නම් ඒ මස් හෝ මාංශාවශේෂ වෙළඳාම සඳහා විවෘතව තැබීම හෝ මිනිසුන්ගේ ආහාරය වශයෙන් පාවිච්චි කිරීම හෝ වැලැක්වීම් වස් වහාම විනාශකර දැමීමට හෝ ඒ පිළිබඳව සුදුස්සක් කිරීමට ඔහු විසින් කටයුතු සැලැස්විය යුතුය. සෞඛ්‍ය වෛද්‍ය නිළධාරියාගේ නියමය යටතේ මිස කිසිම තැනැත්තෙකු විසින් එකී මස් හෝ මාංශාවශේෂ ගෝ ඝාතක ස්ථානයෙන් ඉවත් නොකල යුතුය.

7. මිනිසුන්ගේ ආහාරය පිණිස මරනු ලැබීමට සුදුසුයයි අනුමත කර නැති හෝ 3 වැනි නියෝගයේ (1) ඡේදය යටතේ මැරීම තහනම් කර ඇති කිසිම සතෙකු ගෝඝාතක ස්ථානයේදී මැරීමට ගෝඝාතක ස්ථානය භාරකරු විසින් අවසර නොදිය යුතුය.

8. මිනිසුන්ගේ ආහාරය පිණිස අදහස් කරන ලද යම් සතෙකුගේ කුණපයේ ඉස් සරහ ගාත්වලත් පිටුපස ගාත්වලත් ගෝඝාතක ස්ථානය භාරකරු විසින් "බ.ග.ස." යන අකුරු හා අවස්ථාවෝචිත පරිදි "එළුමස්" හෝ "ගවමස්" යන වචනයන් සඳහන් මුද්‍රාව තබා තිබේනම් මිස කිසිම තැනැත්තෙකු විසින් ඒ කුණපය ගෝඝාතක ස්ථානයෙන් ඉවත් නොකල යුතුය.

9. වෙන යම් සතෙකු ඉදිරියේ හෝ ඒ ස්ථානයේ කලින් මරන ලද සෑම සතෙකුගේම කුණපය ඉවත් කර හෝ මුවාකර ඒ ස්ථානය පිරිසිදු කරනතුරු කිසිම සතෙකු නොමැරිය යුතුය.

10. යම් කිසි බෝවන රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවන රෝගයකින් හෝ සමේ රෝගයකින් පෙළෙන හෝ ළඟදී පෙළෙමින් සිටි හෝ එබඳු රෝගයකින් පෙළෙමින් සිටි යමෙකුට මෑතකදී සාත්තු කිරීමේ යෙදී සිට කිසිම තැනැත්තෙකුට, එකී රෝගය බෝවන හෝ රෝග බීජ බෝරන කාලසීමාව ඉකුත්වනතුරු, යම් කිසි ගෝඝාතක ස්ථානයකට ඇතුලුවීමට හෝ මස් පිණිස සතුන් මැරීමේ කටයුතුවල යෙදීමට එම ගෝඝාතක ස්ථානය භාරකරු විසින් අවසර නොදිය යුතුය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

———————— තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.

(ආ) ඉල්ලුම්කර සිටින තනතුර :———— —.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.
ජාතිය :————.

(එම ලියාපදිංචිවීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, හැඳුනුම් අංකයත් සඳහන් කරන්න.)

3. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—
අවුරුදු :————. මාස :————, දින :————.

(ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා : ————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) පිරවිය යුතුය.)

6. විවාහක ද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | |
|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

| වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය | | |
|---|---|---|
| විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපනික සුදුසුකම් :

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ)—

| | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ට සාමාර්ථය |
|---|---|---|---|---|
| පළවෙනි වාරය | | | | |
| දෙවැනි වාරය | | | | |

(ආ) අ.පො.ස. (උසස් පෙළ)—

| සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ට සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

(ඇ) වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම්—

| විභාගයේ නම | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ඈ) සමර්ථ වී ඇති උසස්ම විභාගය :—

(i) සිංහල :————.

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————.

9. ලබාගෙන ඇති වෘත්තිය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :————,

10. වෘත්තීය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/ දරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාල සීමාවන් :————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවෙද, එසේ නම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

**15. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :———.**

**16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :———.**

**17. චරිත සහතික ලබාගත් අයගේ නම සහ පදවි නාම :———.**

**(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)**

**මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.**

**———,**
**අයදුම්කරුගේ අත්සන**

**දිනය :———.**
**පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,**
**තැ. පෙ. 530, කොළඹ 1.**

---

**පළාත් පාලන සේවය**

ජලකර්මාන්ත ඉංජිනේරු තනතුර (කොළඹ නාගරික සභාව)

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

2. **වැටුප.**—තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප් ක්‍රමය, වර්ෂයකට රු. 17,640—4×600—20,040 කි.

3. **අවශ්‍ය සුදුසුකම්.**—අයදුම්කරුවනට ජලකර්මාන්ත නිර්මාණ හා නඩත්තුව පිළිබඳ පෘථුල පළපුරුද්දක් ද, පාලන කටයුතු පිළිබඳ පළපුරුද්දක් ද සහිතව එම්.අයි.සී.ඊ. සහ එම්.අයි.ඩබ්ලිව්.ඊ. යන සුදුසුකම් තිබිය යුතුය.

4. මෙම ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාලවන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර පළාත් පාලන සේවයේ පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට 1973.11.20 දිනට හෝ ඊට පෙර පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

6. අයදුම්පත් හෝ ඊට අදාල අනිකුත් ලියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නොවේ.

7. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලන ආයතනයක නාගරික කොමසාරිස් වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාර දී තිබී ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

එඩ්ගා ප්‍රනාන්දු,
ලේකම්,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව.

1973 ඔක්තෝබර් මස 08 දින,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 530,
කොළඹ.

10–594—73.10.19 දින අංක82 දරණ ගැසට් පත්‍රය

---

**කුකුළු කෝරළේ උඩපත්තු ගම්සභාව**

ආයුර්වේද බෙහෙත් ශාලා සහකාර තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම 1973 නොවැම්බර් 05 වැනි දින අත්වා මවිසින් භාරගනු ලැබේ.

1. **වැටුප් ක්‍රමය.**—රුපියල් 360—30×9—600 යනු වාර්ෂික වැටුප් ක්‍රමයකි.

2. තනතුර ස්ථිරය. පත්වීම ලබන්නා අවුරුදු 3 ක ආධුනික තත්ත්වයේ තබනු ලැබේ. සේවක අර්ථසාධක අරමුදලේ දායකයෙක් විය යුතු අතර දායකයා සියයට 4 ක් ද ගෙවිය යුතු වේ. සභාවේ දායකය සියයට 6 ක් වනු ඇත.

3. **සුදුසුකම්.**—

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ආ) 1973 නොවැම්බර් 05 දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.
(ඇ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ අධ්‍යාපන පොදු සහතික (සාමාන්‍ය) පෙළ විභාගයෙන් භාෂාවෙන් හා වෙනත් විෂයයන් 5 කින් ද දෙවරකට නොවැඩි වාර ගණනකදී සාමාර්ථය ලබා තිබිය යුතුය.
(ඈ) චරිතය විශිෂ්ඨ විය යුතුය.
(ඉ) ආයුර්වේද බෙහෙත් ශාලා සේවා කටයුතු පිළිබඳ ලබා ඇති පළපුරුද්ද හා දැනුම විශේෂ සුදුසුකමක් වේ.
(ඊ) කුකුළු කෝරළේ උඩපත්තු ගම්සභා ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වීම ගැන විශේෂයෙන් සලකනු ලැබේ.
(උ) තෝරාගනු ලබන අයදුම්කරු විසින් රු. 1,000 ක ඇපයක් තැබිය යුතුය.
(ඌ) මෙම තනතුර සඳහා රැකීරක්ෂා කාර්යාලයේ ලියාපදිංචි විය යුතුය.

4. **සටහන.**—පළාත් පාලන සේවයේ හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයන්හි ස්ථිර හෝ තාවකාලික සේවයේ යෙදී සිටින්නවුන්, අනික් සුදුසුකම් ලබා ඇත්නම්, වයස් සීමාව ගැන නොසැලකේ. ඔවුන් සිය අයදුම් පත් ඉදිරිපත් කළ යුත්තේ සේවයේ නියුතු ප්‍රාදේශීය බල මණ්ඩලයේ ප්‍රධානතුමාගේ මාර්ගයෙනි.

5. අයදුම්කරුවන් තම අයදුම්පත්වලට පහත සඳහන් සහතික පත්වල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය.
(i) උප්පැන්න සහතිකය
(ii) ලබා ඇති ඉහලම අධ්‍යාපන සහතික
(iii) චරිතය පිළිබඳ ලඟදී ලබාගත් සහතික දෙකක්
(iv) පදිංචිය පිළිබඳ සහතිකය (ග්‍රා. ආ. නි/ප්‍රා. උප දිසාපති)
(v) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික
(vi) රැකීරක්ෂා කාර්යාලයේ ලියාපදිංචි වීමේ කාඩ්පත.

6. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ iv වැනි කොටස ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව පිළියෙල කරගනු ලබන අයදුම්පත්, මගින් "පොතුපිටිය, කුකුළු කෝරළේ උඩපත්තු ගම්සභාවේ, පරිපාලන නිලධාරි" යන ලිපිනයට ලේඛන ගත තැපෑලෙන් එවිය යුතුය.

ඇම්. හෙට්ටි ආරච්චි
පරිපාලන නිලධාරි,
කුකුළු කෝරළේ උඩපත්තු ගම්සභාව.

1973.09.24 වැනි දින,
පොතුපිටිය,
කුකුළු කෝරළේ උඩපත්තු ගම්සභා කාර්යාලයේ දිය.

10–810—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

**පළාත් පාලන සේවය**

කොළඹ නගර සභාවේ ප්‍රධාන ඉංජිනේරු තනතුර (කර්මාන්තශාලා)

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත් කැඳවයි.

2. **තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 17,640—4×600—20,040 වේ. මෙයට අමතරව රජයේ නිලධාරීන්ට අදාළ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් ද විවාහක නිලධාරීන්ට ගෙවනු ලැබේ.

3. **අවශ්‍ය සුදුසුකම් :—**

(අ) **වයස :—**1973. 11. 20 වන දිනට වයස අවුරුදු 45 ට නොඅඩු විය යුතුය.

(ආ) **වෘත්තීය සුදුසුකම් :—**අයදුම්කරුවන්ට පහත දැක්වෙන සුදුසුකම් තිබිය යුතුයි.

(1) විදුලිය හා ඔටෝමොබිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ යටත් පිරිසෙයින් අවුරුදු 10 ක පරිපාලන පළපුරුද්දක් සහිතව, එම්. අයි. මෙක්. ඊ. (ලන්ඩන්) හෝ එම්. අයි. ඊ. (ලංකා)

නැතහොත්

යාන්ත්‍රික හා ඔටෝමොබිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ යටත් පිරිසෙසින් අවුරුදු 10 ක පරිපාලන පළපුරුද්ද සහිතව එම්. අයි. ඊ. ඊ. (ලන්ඩන්) හෝ එම්. අයි. ඊ. (ලංකා).

4. මෙම ගැසට් පත්‍රයේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. පළාත් පාලන සේවයේ පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍ර අනුව සම්පාදිත අයදුම්පත් 1973.11.20 වැනි දින හෝ ඊට පෙර පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

6. නියමිත දිනයට පසුව මෙම කාර්යාලයට ලැබෙන රජයේ සේවයේ හෝ පළාත් පාලන සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් භාරගනු ලබන්නේ ඒ අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලන ආයතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස ඉල්ලුම් කළහොත් පමණි.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1973 ඔක්තෝබර් මස 08 දින,
තැ. පෙ. 530,
කොළඹ.

10-595—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

ඇල්. ජී.—බී. 113/47.

## මහනුවර මහ නගර සභාව

මහ නගර සභා ආඥාපනත

(252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 267 වැනි හා 272 (2) වැනි වගන්තිය යටතේ මහනුවර මහ නගර සභාවේ විශේෂ කොමසාරිස් විසින් සම්පාදනය කරන ලැබ, ඒ ආඥාපනතේ 268 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලදුව ජාතික රාජ්‍ය සභාව විසින් ස්ථිර කරන ලද අතුරු ව්‍යවස්ථා.

බී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973. 9. 29 වැනි දින,
කොළඹදී ය.

### ගොඩනැගිලි සැලැසුම්පත් පරීක්ෂා කිරීම හා සලකා බැලීම සම්බන්ධයෙන් අදාළ අතුරු ව්‍යවස්ථා

1. අළුතින් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා හෝ දැනට තිබෙන ගොඩනැගිලි වෙනස් කිරීම සඳහා හෝ (268 වැනි අධිකාරය වන) නිවාස සහ නගර සංවර්ධන ආඥාපනතේ විධිවිධාන යටතේ අනුමත කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්, සැලසුම්පත්, චිත්‍ර සටහන් සහ වැඩ විස්තර පත්‍රිකා පරීක්ෂාකර බැලීම හා සලකාබැලීම සම්බන්ධයෙන් මෙහිවූ උපලේඛනයේ නිශ්චිත ලෙස සඳහන්ව ඇති ගාස්තු ප්‍රමාණයන් අනුව නිගමනය කරනු ලබන ගාස්තුවක් ගෙවිය යුතුය.

2. (1) 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ගෙවිය යුතු ගාස්තුව ගෙවන ලෙස නියම කරමින්, මහනුවර නගර සභාවේ නාගරික කොමසාරිස්වරයාගෙන් ලිපියක් ලද දින සිට දින හතක් ඇතුලතදී නගර සභාවේ අනුමැතිය හෝ කැමැත්ත සඳහා අයැදුම්පත ඉදිරිපත් කරන තැනැත්තා විසින් එම ගාස්තුව ගෙවිය යුතුය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වෝක්ත ඡේදයෙහි නියම කර ඇති කාල සීමාව ඇතුළතදී එකී ගාස්තුව ගෙවීමට අපොහොසත් වන සෑම තැනැත්තෙක්ම වරදකට වරදකරු විය යුතු අතර, එසේ වරදකරු කරනු ලැබීමේදී රුපියල් සියයකට නොවැඩි දඩයක් ගෙවීමට ඔහු යටත් විය යුතුය.

(3) අතුරු ව්‍යවස්ථාවල සඳහන් ගාස්තුව ගෙවනු ලබන තෙක්, කිසිදු අයැදුම්පතක් සැලැසුම්පතක්, චිත්‍ර සටහනක් හෝ වැඩ විස්තර පත්‍රිකාවක් පරීක්ෂාකර බැලීම හෝ සලකා බැලීම නොකළ යුතුය.

#### උපලේඛනය

(1) අළුතින් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා හෝ දැනට පවතින ගොඩනැගිලිවල ගෙබිමේ ප්‍රමාණය විශාල වන අයුරු එය වෙනස් කිරීම සඳහා හෝ ඉදිරිපත් කෙරෙන සැලැසුම්පත් සම්බන්ධයෙන් —

| | රු. ශ. |
|---|---|
| (අ) ගෙබිමේ සම්පූර්ණ ප්‍රමාණය වර්ග අඩි 600 කට වැඩි නොවන කල්හි ... ... | 3 0 |
| (ආ) ගෙබිමේ සම්පූර්ණ ප්‍රමාණය වර්ග අඩි 600 කට වැඩිවන නමුදු, වර්ග අඩි 1000 කට වැඩි නොවන කල්හි ... ... ... | 7 0 |
| (ඉ) ගෙබිමේ සම්පූර්ණ ප්‍රමාණය වර්ග අඩි 1000 කට වැඩි වන නමුදු, වර්ග අඩි 3000 කට වැඩි නොවන කල්හි ... ... ... | 20 0 |
| (ඊ) ඊට අමතර වශයෙන් වන සෑම වර්ග අඩි 1000ක් ඒකකයකට හෝ ඉන් කොටසකට ... | 5 0 |
| 2. දැනට පවතින ගොඩනැගිල්ලක ගෙබිමේ ප්‍රමාණය විශාල නොවන අයුරින් එම ගොඩනැගිල්ල වෙනස් කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන සැලැසුම්පත් ... ... | 5 0 |
| 3. සැලසුම්පත් අළුතින් ඉදිරිපත් නොකර අනුමැතිය අළුත් කර ගැනීම සඳහා පදිරිපත් කෙරෙන අයැදුම්පතක් වෙනුවෙන් ... ... ... | 10 0 |
| 4. ගොඩනැගිලි අවසර පත්‍රයක වලංගු කාල සීමාව දීර්ඝ කර ගැනීම සඳහා ඉදිරිපත් කෙරෙන අයැදුම්පතක් වෙනුවෙන් ... ... | 3 0 |

මෙම උපලේඛනයේ "ගෙබිමේ ප්‍රමාණය" යනුවෙන්, බිම මාල යෙහි හෝ වෙනත් මාලයක බිම් ප්‍රමාණය අදහස් කෙරේ.

10-676—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

ඇල්ඩීල්—බී. 55/52.

## කුරුණෑගල මහ නගර සභාව

### මහ නගර සභා ආඥාපනත

(252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 267 වැනි හා 272 වැනි වගන්ති යටතේ කුරුණෑගල මහ නගර සභාව විසින් පනවනු ලැබුවාවූ ද එකී ආඥාපනතේ 268 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

1973 සැප්තැම්බර් 29 වැනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථා

1. මෙම අතුරු ව්‍යවස්ථා 1973 කුරුණෑගල පොදු වෙළඳපොල පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හැඳින්විය හැකිය.

*වෙළඳසැල් හිස් බිම් ප්‍රමාණයක් හෝ ධාන්‍යාගාර පාවිච්චි කිරීම සඳහා බලපත්‍ර හා මාසයක් හෝ ඊට අඩු කාල පරිච්ඡේදයක් තුළ ඉඩකඩ ඇති ස්ථාන පාවිච්චි කිරීම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම*

2. (1) 3 වැනි ඡේදයේ දැක්වෙන විධිවිධානවලට යටත්ව, පහත සඳහන් කාරණා සම්පූර්ණ වී ඇත්නම් මිස කිසිවෙකු විසින් යම් පොදු වෙළඳපලක තිබෙන යම් වෙළඳසැලක්, හිස් බිම් ප්‍රමාණයක් හෝ ධාන්‍යාගාරයක් ප්‍රයෝජනයට ගැනීම හෝ අයත්කර ගෙන සිටීම නොකළ යුතුය :—

(අ) කොමසාරිස්වරයා විසින් ඒ සඳහා ඔහුට බලපත්‍රයක් නිකුත් කර තිබීම හා එම බලපත්‍රය වලංගුව තිබීම ; සහ

(ආ) 4 වැනි අතුරු ව්‍යවස්ථාවට අනුකූලව ඒ වෙළඳසැල, හිස් බිම් ප්‍රමාණය හෝ ධාන්‍යාගාරය සඳහා නියමිත කුලිය හෝ ගාස්තුව ඔහු විසින් ගෙවනු ලැබීම.

(2) (1) වැනි ඡේදය යටතේ යම් තැනැත්තකු වෙත නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම—

(අ) මෙහි වූ උපලේඛනයේ දැක්වෙන ආකෘති පත්‍රය අනුව විය යුතුයි ; තවද (ආ) පහත සඳහන් කිසිවක් සිදු නොවුවහොත් බලපත්‍රය නිකුත් කළ දින සිට එය නිකුත් කළ වර්ෂයේ දෙසැම්බර් තිස් එක් වැනිදා දක්වා වලංගුව තිබිය යුතුයි :—

(i) 29 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ බලපත්‍රය අවලංගුකරනු ලැබීම ; හෝ

(ii) 3 වැනි අතුරු ව්‍යවස්ථාවෙන් නියමිත දැන්වීම කිරීමෙන් පසු ඒ වෙළඳසැල, හිස් බිම් ප්‍රමාණය හෝ ධාන්‍යාගාරය ප්‍රයෝජනයට ගෙන සිටින තැනැත්තා විසින්ම එය ප්‍රයෝජනයට ගැනීම හෝ අයත් කරගෙන සිටීම අවසන් කරනු ලැබීම ; හෝ

(iii) මහ නගර සභා ආඥාපනතේ (252 වැනි අධිකාරය) 156 වැනි වගන්තිය යටතේ ඒ බල පත්‍රය දරන්නා පොදු වෙළඳ පලෙන් නෙරපනු ලැබීම.

(3) යම් පොදු වෙළඳ පලක තිබෙන ඉඩකඩ ඇති ස්ථානයක් මාසයකට වැඩිනොවූ කාල සීමාවක් තුළ යම් තැනැත්තකු විසින් පාවිච්චි කිරීම පිණිස කොමසාරිස්වරයා විසින්ම හෝ කොමසාරිස්වරයා විසින් ඒ සඳහා බලය පවරන ලද යම් තැනැත්තෙකු විසින් ඉහත කී තැනැත්තා වෙත අවසර පත්‍රයක් නිකුත් කළ හැකිය. මෙම ඡේදය යටතේ නිකුත් කරනු ලබන සෑම බල පත්‍රයක් සඳහාම 4 වැනි අතුරු ව්‍යවස්ථාව අනුව කුළියක් හෝ ගාස්තුවක් ගෙවිය යුතුය.

(4) මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වෝක්ත විධිවිධාන යටතේ නිකුත් කරන ලද බල පත්‍රයක් දරන්නා එම බල පත්‍රයට සම්බන්ධ වෙළඳ සැලෙන් හිස් බිම් ප්‍රමාණයෙන් හෝ ධාන්‍යාගාරයෙන් ඉවත්ව යනවිට ඔහු විසින් ඒ බලපත්‍රය කොමසාරිස්වරයාට හෝ කොමසාරිස්වරයා විසින් බලය පවරන ලද සභාවේ වෙන යම් නිලධාරියෙකුට ආපසු භාරදිය යුතුය.

*බදුකරය අවසාන කිරීම පිළිබඳ නිවේදනය*

3. බලපත්‍රයක් දරන සෑම තැනැත්තකු විසින් ම තම බදුකරය අවසාන කිරීමට තීරණය කළ කල්හි, එම බදුකරය අවසාන කිරීමට තමා අදහස් කරන බවට ලිත් මාසයක් කල් ඇතිව දැන්වීමක් කොමසාරිස්වරයා වෙත භාර දිය යුතුය. නැතහොත් එම දැන්වීම වෙනුවට මාසයක කුලිය ගෙවිය යුතුය.

*කුලී හෝ ගාස්තු*

4. (i) බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් දරන සෑම තැනැත්තකු විසින්ම සභාව විසින් නියම කර ඇති ප්‍රමාණය අනුව බදු මුදලක් හෝ ගාස්තුවක් ගෙවිය යුතුය.

(2) පොදු වෙළඳපලක තිබෙන එක් එක් වෙළඳසැල, හිස් බිම් ප්‍රමාණය හෝ ධාන්‍යාගාරය සඳහා ගෙවිය යුතු බදු මුදල හෝ ගාස්තුව (3) වැනි ඡේදයෙහි නිශ්චිත වේලාවන්හි දී කොමසාරිස්වරයාට හෝ එම බදු මුදල හෝ ගාස්තුව අය කිරීමට සභාව විසින් පත්කර ඇති නිලධාරියාට ගෙවිය යුතුය.

(3) ඒ බදු මුදල හෝ ගාස්තුව—

(අ) බල පත්‍රයක් සම්බන්ධයෙන් නම්, එය නිකුත් කරනු ලැබූ වේලාවේදී, හෝ එම අවසර පත්‍රයට විෂය වූ කාල සීමාව තුළ එක් එක් ලිත් මාසයේ පළමුවැනි දින මාසික කොටස් මුදලක් වශයෙන් ගෙවිය යුතුය ;

(ආ) අවසර පත්‍රයක් සම්බන්ධයෙන් නම්, එය නිකුත් කරනු ලැබූ වේලාවේදී ගෙවිය යුතුය.

*බලපත්‍ර හෝ අවසර පත්‍ර වෙනත් අයට පැවරීමට නොහැකි බව වෙළඳ සැල් හිස්බිම් ප්‍රමාණයන් හෝ ධාන්‍යාගාර අතුරු බදු දීම හා පාවිච්චි කිරීම පිළිබඳ විධිවිධාන*

5. (i) බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් දරන කිසිම තැනැත්තකු විසින් කොමසාරිස්වරයාගේ ලිඛිත අවසරය නොමැතිව—

(අ) ඒ බලපත්‍රය හෝ අවසර පත්‍රය වෙනත් තැනැත්තකුට පැවරීම ; හෝ

(ආ) තමන්ට වෙන්කර දී ඇති වෙළඳසැලේ, හිස් බිම් ප්‍රමාණයේ හෝ ධාන්‍යාගාරයේ යම් කොටසක් අතුරු බදු දීම; හෝ

(ඇ) බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ නම සඳහන් වන්නාවූ ද මහා නගර සභා කාර්යාලයේ නම ලියාපදිංචි වී තිබෙන්නාවූද සේවකයෙකු හෝ නියෝජිතයෙකු හැර වෙන කිසිම තැනැත්තකුට වෙළඳ සැලේ, හිස් බිම් ප්‍රමාණයේ හෝ ධාන්‍යාගාරයේ යම් කොටසක් පාවිච්චි කිරීම හෝ අයත් කරගෙන සිටීමට අවසර දීම

නොකළ යුතුය.

*වෙළඳසැලේ හිස් බිම්ප්‍රමාණයේ හෝ ධාන්‍යාගාරයේසීමා වලින් පිටත ඉඩ අල්ලා ගෙන නො සිටිය යුතු බව*

(2) කොමසාරිස්වරයාගේ ලිඛිත අවසරයක් නොමැතිව කරන ලද යම් පැවරීමක් හෝ අතුරු බද්දක් යටතේ කිසිම තැනැත්තෙකු විසින් පොදු වෙළඳපලක පිහිටි යම් වෙළඳ සැලක්, හිස් බිම් ප්‍රමාණයක් හෝ ධාන්‍යාගාරයක් නැතහොත් ඉන් යම් කොටසක් ප්‍රයෝජනය ගැනීම හෝ අයත් කරගෙන සිටීම නොකළ යුතුය.

6. බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් දරන්නා විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු හෝ සේවකයකු විසින්, තම බලපත්‍රය හෝ අවසර පත්‍රය යටතේ තමාට පාවිච්චි කිරීමට හෝ අයත්කරගෙන සිටීමට බලය පවරා දී තිබෙන වෙළඳ සැල, හිස් බිම් ප්‍රමාණය හෝ ධාන්‍යාගාරය හැර පොදු වෙළඳපොලක වෙනයම් කොටසක් ප්‍රයෝජනයට ගැනීම හෝ අයත් කරගෙන සිටීම නොකළ යුතුය.

*වෙළඳසැලේ, හිස්-බිම්ප්‍රමාණයේ හෝ ධාන්‍යාගාරයේසීමාවන්ගෙන් පිටතට කිසිවක් නෙරා නොයා යුතුබව*

7. යම් පොදු වෙළඳපලක තිබෙන යම් වෙළඳසැලක්, හිස් බිම් ප්‍රමාණයක් හෝ ධාන්‍යාගාරයක් අයත්කරගෙන සිටින්නෙකු විසින් එම වෙළඳසැලේ, හිස් බිම් ප්‍රමාණයේ හෝ ධාන්‍යාගාරයේ වෙළඳාම සඳහා තැන්පත් කර හෝ ඉදිරිපත් කර තිබෙන භාණ්ඩ කිසිවක් එම වෙළඳසැලේ හිස් බිම් ප්‍රමාණයේ හෝ ධාන්‍යාගාරයේ සීමාවන්ගෙන් පිටතට නෙරායාමට සැලැස්වීම හෝ ඉඩ හැරීම නොකළ යුතුය.

*කුණු කසළ ආදිය දැමීම සඳහා බඳුන් තැබිය යුතුබව*

8. (1) බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් දරන සෑම තැනැත්තකු විසින්ම කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි වර්ගයේ හා ප්‍රමාණයේ බඳුනක් තම වෙළඳසැලේ, හිස් බිම් ප්‍රමාණයේ හෝ ධාන්‍යාගාරයේ තැබිය යුතු අතර අතුගා ඉවත දමන සියලු දෑත්, කුණු කසළ හා රොඩුත්, එහි බහාලිය යුතුය ; නැතහොත් බහාලීමට සැලැස්විය යුතුය.

(2) බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් දරන කිසිම තැනැත්තකු විසින් නැතහොත් ඔහුගේ නියෝජිතයෙකු හෝ සේවයෙකු විසින් යම් ඇටකටු, සම් හෝ මාළුවන්ගේ වරල් හෝ කොරපොතු හෝ යම් කුණු කසළ හෝ අතුගා ඉවත දමන දෑ පොදු වෙළඳපලට අයත් භූමියේ පිහිටි යම් කාණුවකට හෝ වෙනයම් කොටසකට විසිකිරීමට හෝ විසිකිරීමට සැලැස්වීම නොකළ යුතුය.

*පොදු වෙළඳපලට අයත් භූමිය තුළ සේදීම තහනම් බව*

9. බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් දරන්නෙකු විසින් නැතහොත් ඔහුගේ නියෝජිතයෙකු හෝ සේවකයෙකු විසින් යම් මස් මාළු හෝ එළවළු හෝ වෙනයම් භාණ්ඩයක් පොදු වෙළඳපලට අයත් භූමියේ ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයක මිස එහි වෙනයම් කොටසක සේදීම, කැපීම හෝ පිරිසිදු කිරීම හෝ සේදීමට, කැපීමට හෝ පිරිසිදු කිරීමට සැලැස්වීම නොකළ යුතුය.

*වෙළඳසැල්, හිස් බිම් ප්‍රමාණයන් හා ධාන්‍යාගාර අතුගෑ යුතු බව හා බංකු මේසආදිය පිරිසිදුව තබාගත යුතුබව*

10. බලපයයක් හෝ අවසර පත්‍රයක් දරන සෑම තැනැත්තකු විසින්ම—

(අ) තමා විසින් අයත්කරගෙන සිටින වෙළඳසැල, හිස් බිම් ප්‍රමාණය හෝ ධාන්‍යාගාරය සහ තම වෙළඳසැලට, හිස් බිම් ප්‍රමාණයකට හෝ ධාන්‍යාගාරයට පිවිසීම සඳහා යම් එළිමහන් ස්ථානයක් ඇත්නම් එයද, දිනපතා අතු ගෑ යුතුය. නැතහොත් අතු ගෑමට සැලැස්විය යුතුය. තවද

(ආ) වෙළඳාම සඳහා ආහාර ද්‍රව්‍ය හා බිම් ද්‍රව්‍ය තබා හෝ ඉදිරිපත් කොට තිබෙන සෑම බංකුවක රාක්කයක්, කවුන්ටරයක් හෝ මේසයක් දිනපතා ඉතා හොඳින් පිරිසිදු කිරීමට සැලැස්විය යුතු අතර, වෙළඳාම සඳහා මස් හෝ මාළු තබා හෝ ඉදිරිපත් කොට තිබෙන සෑම පුවරුවක්ම දිනපතා සූරා පිරිසිදු කිරීමට සැලැස්විය යුතුය.

*මස් වෙළඳසැලේ අංකයත්, මස්වල මිලත් දැක්වෙන පුවරුවත්ප්‍රදර්ශනය කළ යුතුබව*

11. යම් වෙළඳසැලක යම් මස් වර්ගයක් වෙළඳාම් කිරීම සඳහා බලය පවරා නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නා විසින් එම වෙළඳසැලේ අංකයක් එහි විකුණනු ලබන මස්වල තත්කාලීන මිලත් දැක්වෙන පුවරුවක් වෙළඳසැලේ ප්‍රකට ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතුය.

*කුකුළන් නිදැල්ලේ හැරීමට අවසර නොදෙන බව*

12. කුකුළන් විකිණීමට බලය පවරා නිකුත් කරන ලද බලපත්‍රය හෝ අවසර පත්‍රයක් දරන්නා විසින් තමාට අයත් යම් පක්ෂියෙකුට පොදු වෙළඳපලට අයත් භූමියේ කිසිම කොටසක නිදැල්ලේ යාමට ඉඩ නොතැබිය යුතුය.

*සොරකමකට වරද කරුවන් වූ අයට යම් වෙළඳසැලක් අයත්කරගෙන සිටීම හෝ වෙළඳ සැලක සේවය කිරීම කළ නොහැකි බව*

13. (1) බලපයත්‍රක් හෝ අවසර පත්‍රයක් දරන්නෙකු විසින්, වරදකරු කරනු ලැබූ යම් කිසිවෙකු තම නියෝජිතයා හෝ සේවකයා වශයෙන් ස්වකීය වෙළඳසැලේ, හිස් බිම් ප්‍රමාණයේ හෝ ධාන්‍යාගාරයේ සේවයේ නොයෙදවිය යුතුය.

(2) සොරකමකට වරදකරු කරනු ලැබූ කිසිම තැනැත්තකු විසින් යම් පොදු වෙළඳපලක යම් වෙළඳසැලක්, හිස් බිම් ප්‍රමාණයක් හෝ ධාන්‍යාගාරයක් අයත්කරගෙන නොසිටිය යුතුය.

*ස්පර්ශජ රෝග වලින් පෙළෙන තැනැත්තන් සම්බන්ධයෙන් වූ සීමා කිරීම.*

14. බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් දරන කිසිම තැනැත්තකු—

(අ) යම් චර්ම රෝගයකින්, ස්පර්ශජ රෝගයකින් හෝ බෝවෙන රෝගයකින් පෙළෙන කල, තම වෙළඳසැලට හිස්බිම් ප්‍රමාණයට හෝ ධන්‍යාගාරයට ඇතුළුවීම හෝ එහි යම් වෙළඳමක යෙදීම නොකළ යුතුය ; නැතහොත්

(ආ) යම් චර්ම රෝගයකින්, ස්පර්ශජ රෝගයකින් හෝ බෝවෙන රෝගයකින් පෙළෙන කිසිවෙකු තම වෙළඳසැලේ හිස් බිම් ප්‍රමාණයේ හෝ ධාන්‍යාගාරයේ සේවයේ යෙදවීම හෝ එබඳු තැනැත්තෙකුට ඒ වෙළඳසැලේ හිස් බිම් ප්‍රමාණයේ හෝ ධාන්‍යාගාරයේ යම් වෙළඳාමක යෙදීමට අවසර දීම නොකළ යුතුය.

*නින්ද කිරීම, හිංසා කිරීම, පීඩා කිරීම ආදිය.*

15. බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් දරන්නෙකු විසින් නැතහොත් ඒ තැනැත්තාගේ නියෝජිතයකු හෝ සේවකයෙකු විසින් එම බලපත්‍රය හෝ අවසර පත්‍රය අදාලවන වෙළඳ සැලට, හිස් බිම් ප්‍රමාණයට හෝ ධාන්‍යාගාරයට හෝ පොදු වෙළඳපලේ වෙනයම් කොටසකට පැමිණෙන කිසිවෙකු යම් නින්දවකට, හිංසාවකට, පීඩාවකට හෝ ප්‍රමාදයකට භාජනය නොකළ යුතුය.

*ගිනි හා පහන්*

16. පොදු වෙළඳපලක තිබෙන යම් ගොඩනැගිල්ලක්, වෙළඳසැලක්, හිස් බිම් ප්‍රාමාණයක් හෝ ධාන්‍යාගාරයක් බදු ගෙන හෝ අයත් කරගෙන සිටින් සෑම තැනැත්තකු විසින්ම නැතහොත් බදුගෙන හෝ අයත්කරගෙන සිටින යම් තැනැත්තකුගේ සේවකයකු විසින් එකී ගොඩනැගිල්ලේ, වෙළඳසැලේ හිස් බිම් ප්‍රමාණයේ හෝ ධාන්‍යාගාරයේ දල්වා තිබෙන සෑම ගින්නක් හෝ පහනක්ම ඒ ගොඩනැගිල්ලෙන්, වෙළඳසැලෙන්, හිස් බිම් ප්‍රමාණයෙන් හෝ ධාන්‍යාගාරයෙන් තමා නික්ම යාමට පෙර නිවා දැමීම හෝ නිවා දැමීමට සැලැස්වීම කළ යුතු අතර, ඒ බදුකරු අයත්කරගෙන සිටින්නා හෝ සේවකයා විසින් ඒ ගොඩනැගිල්ලේ, වෙළඳ සැලේ හිස් බිම් ප්‍රමාණයේ හෝ ධාන්‍යාගාරයේ සුරක්ෂිතභාවයට අනතුරුදායක වූ යම් ගින්නක් හෝ පහනක් දැල්වීමට හෝ දල්වා තැබීමට සැලැස්වීම අවසරදීම නොකළ යුතුය.

*පොදු වෙළඳපලට අයත් භූමිය තුළ ආහාර පිසීම, බීමත්ව සිටීම, සිඟා කෑම හා නිකරුණේ හැසිරීම තහනම් බව.*

17. කිසිම තැනැත්තකු විසින් පොදු වෙළඳපල තුළ හෝ ඊට අයත් භූමිය තුළ—

(අ) ආහාර පිසීම සඳහා සභාව විසින් වෙන්කොට ඇති, එසේම සභාව විසින් අනුමත කළහැකි වර්ගයේ උදුන් එකක් හෝ ඊට වැඩි ගණනක් ඇති ස්ථානයක හැර අන් ස්ථානයක ආහාර පිසීම ; හෝ

(ආ) බීමත්ව සිටීම හෝ නොනිසි ලෙස හැසිරීම සෝෂාකිරීම හෝ අනුන්ට බාධා කිරීම හෝ වෙනයම් අයෙකු සමග පොරබැදීම හෝ නින්ද ගෙන දෙන, අපහාසාත්මක හෝ අශ්ලීල භාෂාවෙන් කතා කිරීම ; හෝ

(ඇ) සිගාගෑම ; හෝ

(ඈ) තමා පිළිබඳ සතුටුදායක විස්තරයක් දී ගත නොහැකි ව නිකරුණේ ඔබ මොබ හැසිරීම හෝ පොදු වෙළඳපළ පරිපාලන තැන විසින් හෝ කොමසාරිස්වරයකුගේ නීත්‍යානුකූල ආඥා යටතේ ක්‍රියා කරන වෙනත් අයෙකු විසින් පිටවී යනලෙස අණ කිරීමෙන් පසුව රැඳී සිටීම නොකළ යුතුය.

*පොදු වෙළඳපලට අයත් භූමිය තුළ ඇතැම් දේ කිරීම තහනම් කිරීම.*

18. කිසිම තැනැත්තකු විසින්—

(අ) පොදු වෙළඳපලට අයත් ගොඩනැගිල්ලේ යම් කොටසකට හෝ පොදු වෙළඳ පලක් තුළ හෝ ඒ අසල තිබෙන නගර සභාව සතු ලී බඩු, පහන් හෝ වෙනත් දේපලවලට අලාභහානියක් කිරීම හෝ ඒවා විරූප කිරීම ;

(ආ) පොදු වෙළඳපලක පාවිච්චිය හෝ වෙනත් කාර්‍ය්‍යයක් සඳහා සපයා තිබෙන ජලය අපවිත්‍ර කිරීම, දූෂ්‍ය කිරීම, හෝ නාස්ති කිරීම හෝ එම ජලයෙන් තම ශරීරය, සතුන් ඇඳුම් හෝ භාණ්ඩ සේදීම ; හෝ

(ඇ) යම් පොදු වෙළඳ පලකට අයත් භූමිය තුල කෙළ ගැසීම හෝ කාරා දැමීම ; හෝ

(ඈ) යම් පොදු වෙළඳපලක් වසා දැමීමෙන් පසු එයට අයත් භූමිය තුල නිදා ගැනීම ; හෝ

(ඉ) පොදු වෙළඳපලකට අයත් භූමියේ යම් කොටසක පැදුරු එල්ලා තැබීම හෝ ඇඳුම් වේලීම; හෝ

(ඊ) යම් පොදු වෙළඳපලකට අයත් භූමිය තුළ යම් බල්ලකු හෝ වෙනත් සතකු ඇති කිරීම හෝ ඌ එම භූමියට ගෙන ඒම හෝ තමාට අයත් යම් බල්ලකුට හෝ වෙනත් සතකුට ඒ භූමිය තුළ ඔබ මොබ හැසිරීමට ඉඩ දීම, හෝ නොකළ යුතුය.

(උ) යම් පොදු වෙළඳ පලකට අයත් භූමිය ඇතුළත ඒ කාර්‍ය්‍යය සඳහා වෙන්කර ඇති වෙළඳසැලක හැර අන් තැනක කිසිම පක්ෂියකු තබා ගැනීම හෝ තමන්ට අයිති යම් පක්ෂියකුට ඒ භූමිය ඇතුළත නිදැල්ලේ හැසිරීමට ඉඩ හැරීම නොකළ යුතුය.

19. කිසිම තැනැත්තකු විසින් මහා නගර සභා ගෝඝාතක ස්ථානයක නොමරණ ලද යම් සතෙකුගේ යම් මළකුණක් හෝ යම් මසක් යම් පොදු වෙළඳපලකට ගෙන ඒම හෝ එහි වෙළඳාම සඳහා ඉදිරිපත් කිරීම හෝ වෙළඳාම් කිරීම නොකළ යුතුය.

බලපත්‍රයක් යටතේ ලංකාවට ආනයන කරන ලද ශීත කළ මස් හෝ මසට ගනු ලබන සතුන් විකිණීම සම්බන්ධයෙන් මෙම අතුරු ව්‍යවස්ථාව අදළ නො විය යුතුය.

නගර සභා ගෝඝාතක ස්ථානයෙහි මරන ලද සතුන් ගේ මස් හැර වෙනත් සතුන්ගේ මස් විකිණීම තහනම් බව

20. (1) (2) වැනි හා (3) වැනි ඡේදවල විධිවිධානවලට යටත්ව, සභාව විසින් තත් කාර්‍ය සඳහා පිහිටුවා තිබෙන පොදු වෙලඳපලක් හැර කිසිම තැනැත්තකු විසින් මහා නාගරිකය තුළ මස් හෝ මාළු විකිණීම හෝ වෙළඳාම සඳහා ඒවා ඉදිරිපත් කිරීම හෝ තැබීම නොකළ යුතුය.

(2) කොමසාරිස්වරයා විසින්, පොදු වෙළඳපලක හැර මහා නගර සභා සීමාව තුළ පිහිටි වෙන යම් ස්ථානයක මාළු වෙළඳාම් කිරීමට බලය පවරා යම් සංචාරක වෙළෙන්දකුට බලපත්‍ර නිකුත් කළ හැකිය. ඒ එක් එක් බලපත්‍රය සඳහා සභාව විසින් කලින් කල නියම කරනු ලබන මාසික ගාස්තුවක් අය කළ යුතුය.

(3) සභාව විසින් නියම කළ තැකි අන්දමේ ගාස්තුවක් ගෙවූ විට පොදු වෙළඳ පලක හැරුණු විට වෙන යම් ස්ථානයක දී ආනයනය කරන ලද, මස්, මාළු හෝ මස් සඳහා ගනු ලබන සතුන් විකිණීමට බලය පවරමින් කොමසාරිස්වරයා විසින් යම් තැනැත්තකුට බලපත්‍රයක් නිකුත් කළ හැකිය.

ඇතැම් අවස්ථාවලදී හැර පොදු වෙළඳ පලක් නොවන ස්ථානයක මස් හෝ මාළු විකිනීම තහනම් බව

21. 20 වැනි අතුරු ව්‍යවස්ථාවට පටහැනිව විකිණීම සඳහා තබනු ලබන හෝ තැනින් තැන ගෙනයනු ලබන යම් මස් හෝ මාළු වර්ගයක් කොමසාරිස්වරයාගේ බලය යටතේ ක්‍රියා කරන සභාවේ යම් නිලධාරියෙකු විසින් හෝ තනතුරින් උප පොලිස් පරීක්ෂකයකුට වඩා පහත් නොවූ පොලිස් නිලධරයකු විසින් තහනමට ගැනීම හා කොමසාරිස් වරයා විසින් නියම කළ හැකි ආකාරයකින් එයට සුදුස්සක් කිරීම සඳහා මහා නගර සභා කාර්යාලයට ගෙනයාමත් නීත්‍යානුකූල විය යුතුය.

යථෝක්ත අතුරු ව්‍යවස්ථා කඩකර විකුණනු ලබන මස් හෝ මාළු තහනමට ගත හැකි බව

22. (1) බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් දරන්නෙකු විසින් තම බල පත්‍රයේ හෝ අවසර පත්‍රයේ නිශ්චිත වශයෙන් දක්වා නැත්තාවූ හෝ අපථ්‍ය වූ හෝ මහජන සෞඛ්‍යයට යම් ආකාරයකින් හානිකර වූ කිසියම් භාණ්ඩයක් ස්වකීය වෙළඳසැලේ, හිස් බිම් ප්‍රමාණයේ හෝ ධාන්‍යාගාරයේ වෙළඳාම සඳහා ඉදිරිපත් කිරීම හෝ තැබීම නොකළ යුතුය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදයේ විධිවිධානවලට පටහැනිව වෙළඳාම සඳහා ඉදිරිපත් කරනු ලබන හෝ තබනු ලබන යම් භාණ්ඩයක් කොමසාරිස්වරයාගේ බලය යටතේ ක්‍රියා කරන යම් නිලධාරියෙකු විසින් තහනමට ගෙන මහා නගර සභා කාර්යාලයට ගෙන යාම නීත්‍යානුකූල විය යුතුය.

බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ නිශ්චිත වශයෙන් දක්වා නැති භාණ්ඩ හෝ සෞඛ්‍යයට හානිකර භාණ්ඩ විකිණීම තහනම් බව

23. (1) මහජනයා සමඟ ගනුදෙනු කිරීම සඳහා තම වෙළඳසැල, හිස් බිම් ප්‍රමාණය හෝ ධාන්‍යාගාරය පෙ.ව. 7 ත් ප.ව. 6 ත් අතර කාලය තුළ විවෘත කර තැබීම, බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් දරන සැම තැනැත්තකුගේම යුතුකම විය යුතුය.

(2) කොමසාරිස්වරයාගෙන් කලින් ලබාගත් ලිඛිත අවසරයක් නොමැතිව, බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් දරන කිසිම තැනැත්තකු විසින් මහජනයාට සේවය කිරීම පිට පිටම දින දෙකක් ඔනෑකමින්ම නොසලකා හැරීම හෝ ප්‍රතික්ෂේප කිරීම නොකළ යුතුය.

වෙළඳසැල්, හිස්බිම් ප්‍රමාණයන් හා ධාන්‍යාගාර මහජනයා සඳහා විවෘතකර තැබිය යුතුය. විවෘතකරන හා වසන වේලාවල්

24. යම් බදු මුදලක් හෝ ගාස්තුවක් සම්බන්ධයෙන් වූ යම් ආරාවුලක් වගවිභාගකර බැලීමටත් යුක්තිසහගතයැයි තමාට හැඟි යාහැකි තීරණයක් ඒ සම්බන්ධයෙන් කිරීමටත් කොමසාරිස්වරයාට බලය තිබිය යුතුය.

කුලී හෝ ගාස්තු සම්බන්ධයෙන් පැනනගින ආරාවුල් වග විභාග කර බැලීමට කොමසාරිස්වරයාට ඇති බලය

25. කිසිම තැනැත්තකු විසින් යම් පොදු වෙළඳපලක භාරකරුවෙකුට හෝ යම් පොදු වෙළඳපලක් පරිපාලනය කිරීමට හෝ එහිදී බදු මුදල් හෝ ගාස්තු එකතු කිරීමට හෝ එහි සාමය හා පවිත්‍රත්වය ආරක්ෂා කිරීමට සභාව විසින් පත් කරන ලද යම් නිලධාරියෙකුට ස්වකීය රාජකාරි ඉටුකිරීමේදී විරුද්ධකම් පෑම්, බාධාකිරීම්, අවහිර කිරීම හෝ හිරිහැර කිරීම නොකළ යුතුය.

පොදු වෙළඳපලට අයත් භූමිය තුළ රාජකාරිවල යෙදී සිටින සභාවේ නිලධාරින්ට හා වෙනත් අයට විරුද්ධකම් පෑම්, බාධාකිරීම් ආදිය

26. බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් දරන කිසිම තැනැත්තකු විසින්, කොමසාරිස්වරයා විසින් අනුමත නොකරන ලද යම් සංඥා පුවරුවක් ස්වකීය වෙළඳසැලේ, හිස් බිම් ප්‍රමාණයේ හෝ ධාන්‍යාගාරයේ ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම නොකළ යුතුය.

කොමසාරිස්වරයා විසින් අනුමත නොකරන ලද සංඥා පුවරු ප්‍රදර්ශනය කිරීම තහනම් බව

**පොදු වෙළඳ පලට අයත් භූමිය තුළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

27. බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් දරන්නෙකු විසින් කොමසාරිස්වරයාගේ ලිඛිත අනුමැතිය නොමැතිව යම් පොදු වෙළඳ පලකට අයත් භූමිය තුළ ප්‍රසිද්ධ වෙන්දේසියේ යම් විකිණීමක් නොකළ යුතුය.

**ශබ්ද විකාශන යන්ත්‍ර ග්‍රැමපෝන් ආදිය පාවිච්චි කිරීම තහනම් බව**

28. කිසිම තැනැත්තකු විසින් යම් පොදු වෙළඳපලක තිබෙන යම් වෙළඳසැලක, හිස් බිම් ප්‍රමාණයක හෝ ධාන්‍යාගාරයක යම් ශබ්ද විකාශන යන්ත්‍රයක්, ග්‍රැමපෝනයක්, ගුවන් විදුලි යන්ත්‍රයක්, රිඩිපියුෂන් යන්ත්‍රයක්, ශබ්ද විහිදුවන උපකරණයක් හෝ එවැනි වෙනත් උපකරණයක් ක්‍රියාකරවීම නොකළ යුතුය.

**බලපත්‍ර හෝ අවසර පත්‍ර දරන්නන් වරදකරුවන්වූ විට උසාවිය මගින් බලපත්‍ර හෝ අවසර පත්‍ර අවලංගු කිරීම හා වරදකරුවන් වූ අයට බලපත්‍ර හෝ අවසර පත්‍ර නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට කොමසාරිස්වරයාට ඇති බලය**

29. (1) යම් බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් දරන්නා විසින් ඉහත දැක්වෙන යම් අතුරු ව්‍යවස්ථාවක් කඩකිරීම සම්බන්ධයෙන් නිසි අධිකරණ බලය ඇති උසාවියක් මගින් දෙවන වරට හෝ ඉන් ඉක්බිතිව ඔහු වරදකරුවෙකු කරනු ලැබුවහොත් 2 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කර ඇති යම් බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් ඒ අධිකරණය විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල විය යුතුය.

(2) තම බලපත්‍රය හෝ අවසර පත්‍රය අවලංගු කරන ලද යම් තැනැත්තකුට හෝ ඉහත දැක්වෙන අතුරු ව්‍යවස්ථා කිසිවක් කඩ කිරීම සම්බන්ධයෙන් හෝ දණ්ඩ නීති සංග්‍රහය යටතේ යම් වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකුට අලුත් බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් නිකුත් කිරීම කොමසාරිස්වරයා විසින් ප්‍රතික්ෂේප කළ හැකිය.

**දණ්ඩනය**

30. මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන කිසිවක් උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් සියයකට නොවැඩි දඩයකටද දෙවන වරට හෝ ඉන් ඉක්බිතිව කරන ලද වරදක් සම්බන්ධයෙන් රුපියල් දෙසියකට නොවැඩි දඩයකටද උල්ලංඝනය නොනවත්වාම කරගෙන යනු ලැබුවහොත් වරදකරු කරනු ලැබීමෙන් පසු නොහොත් කොමසාරිස්වරයා විසින් ඒ උල්ලංඝනය කෙරෙහි අවධානය යොමුකරවන ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසුත්, එම උල්ලංඝනය කෙරියෙන එක් එක් දවසට රුපියල් විසිපහකට නොවැඩි දඩයකට ද යටත්විය යුතුය.

උපලේඛනය

බලපත්‍ර ආකෘතිය—2 (2) (අ) වැනි අතුරු ව්‍යවස්ථාව

............................................................පොදු වෙළඳපලේ පිහිටි අංක............................................දරන වෙළඳසැල/හිස් බිම් ප්‍රමාණය/ධාන්‍යාගාරය..........................................................................ක මාසික බදු මුදලක්/..............................................................................ක දෛනික ගාස්තුවක් ගෙවූ පසු..............................................................................................පිහිටි පොදු වෙළඳපලේ තිබෙන අංක..............................................................................දරන/වෙළඳසැල/හිස් බිම් ප්‍රමාණය/ධාන්‍යාගාරය..............................................................................වෙළඳාම කරගෙන යාම සඳහා පාවිච්චි කිරීමට හෝ අයත් කරගෙන සිටීමට..............................................................ට මෙයින් බලය පවරනු ලැබේ.

උසාවියක් මගින් අවලංගු කරනු නොලැබුවහොත් හෝ සභාවට ලිත් මාසයක් කලින් ලිඛිත දැන්වීමක් කිරීමෙන් පසු බලපත්‍රය දරන්නා විසින් එකී වෙළඳසැල/හිස් බිම් ප්‍රමාණය/ධාන්‍යාගාරය ප්‍රයෝජනයට ගැනීම හෝ එය අයත් කරගෙන සිටීම නතර කරනු නොලැබුවහොත් හෝ මහ නගර සභා ආඥපනතේ (252 අධිකාරය) 156 වැනි වගන්තිය යටතේ බලපත්‍රය දරන්නා එම පොදු වෙළඳ පලෙන් නෙරපනු නොලැබුවහොත් මෙම බලපත්‍රය 19......දෙසැම්බර් මාසය තෙක් වලංගුව පවතිනු ඇත.

කුරුණෑගල මහ නගර සභාවේ කොමසාරිස්.

19..............................................වැනි දිය.

අදාල නොවන්නේ යමක්ද, එය කපා හරින්න.

10–673—73.10.19 දින අංක 82 දරන ගැසට් පත්‍රය

---

නගර සභා ආඥපනත

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥපනතේ 153 වෙනි සහ 157 වෙනි වගන්තිය යටතේ ත්‍රිකුණාමලයේ නගරයේ විශේෂ කොමසාරිස් විසින් සාදනු ලැබ, ඒ ආඥපනතේ 151 වෙනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973.9.19 වෙනි දින,
කොළඹදීය.

අතුරු ව්‍යවස්ථාව

**පොදු වෙළඳ පොලවල්**

1957 ජූනි මස 28 වෙනි දින අංක 11,137 දරන ගැසට් පත්‍රයේ පලකරන ලද යෝජනාවෙන් ත්‍රිකුණාමලය නගර සභාව විසින් පිළිගන්නා ලද සම්මත අතුරු ව්‍යවස්ථාවන්හි XVI කොටසේ 4 වෙනි අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා කඩපිලක්, ආසනයක් හෝ ඉඩක් වශයෙන් පාවිච්චි කිරීම සඳහා මෙහි වූ උප ලේඛනයෙහි දක්වා ඇති ප්‍රමාණයන් අනුව බදු කුලියක් හෝ ගාස්තුවක් මෙයින් නියම කරනු ලැබේ.

උපලේඛනය

| | දිනකට රු. ශ. |
|---|---|
| 1. එක් ස්ථිර කඩපිලක් සඳහා ... ... | 1 50 |
| 2. එක් තාවකාලික කඩපිලක් සඳහා ... ... | 1 25 |
| 3. වෙළඳ පොල භූමියේ වර්ග අඩි 10 කට වැඩි නොවන එක් විවෘත ඉඩ ප්‍රමාණයක් සඳහා ... | 75 |
| 4. වෙළඳ පොල භූමියේ වර්ග අඩි 10 කට වැඩි වන එහෙත් වර්ග අඩි විස්සකට (20) වැඩි නොවන එක් ඉඩ ප්‍රමාණයක් සඳහා ... ... | 1 0 |
| 5. වෙළඳ පොල භූමියේ වර්ග අඩි විස්සකට (20) වැඩි වන එහෙත් වර්ග අඩි විසිපහකට (25) වැඩි නොවන එක් ඉඩ ප්‍රමාණයක් සඳහා ... | 1 25 |

10–741—73.10.19 දින අංක 82 දරන ගැසට් පත්‍රය

# අය-වැය ලේඛන

## වත්තල-මාබෝලෙ නගර සභාව

1973 අයවැය ලේඛණය

1 වන අතිරේක අයවැය ලේඛණය—විදුලි අංශය

| වැය ශීර්ෂය | මුදල | අනුමත කල යෝජනා අංකය හා දිනය |
|---|---|---|
| ඊඊ.—3 (ඒ) වැටුප් සහ වේතන ... ... ... | 4,000 0 | ... අංක 25 හා 73.10.02 |
| ඊඊ.—3 (බී) විවාහ දීමනා ... ... ... | 1,700 0 | |
| ඊඊ.—3 (ඕ) රක්ෂණ ගාස්තු ... ... ... | 700 0 | |
| | 6,400 0 | |

පි. ආර්. පි. ඩයස්,
සභාපති,
වත්තල-මාබෝල නගර සභාව.

1973.10.05 දින,
වත්තල-මාබෝලෙ නගර සභා කාර්යාලය.

10-692—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

## වත්තල—මාබෝලෙ නගර සභාව

1973 අයවැය ලේඛනය

**මුදල් රෙගුලාසි 12 (ii) යටතේ කෙරෙන අයදුම් පත්‍රය**

1973 වර්ෂයේ අයවැය ලේඛනයේ පහත දක්වෙන වැය ශීර්ෂයන් යටතේ ඉතිරිවේයැයි ගණන් බලන ලද මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂ යන්ට මාරුකර, අවශ්‍යව තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂයන් යටතේ යෙදවීමට අංක 16 හා 73.10.02 දින නගර සභා සම්මුතිය යටතේ තීරණය කර ඇති බැව් මෙයින් නිවේදනය කරමි.

| මුදල් ඉතිරිවේයැයි ගණන් බලා ඇති වැය ශීර්ෂය | මුදල් රු. ශ. |
|---|---|
| ඒ.—1 (බී) ලිපිකරු වැටුප් ... ... | 2,000 0 |
| ඒ.—2 (ඩී) තක්සේරුකරුවන්ගේ ගාස්තු ... ... | 7,500 0 |
| ඒ.—2 (එච්) කරත්ත හා වාහන තහඩු ... ... | 500 0 |
| ඒ.—4 පාඨශාලීය පොත් නොමිලේ දීම ... ... | 1,500 0 |
| ඒ.—5 ආධාර ... ... ... | 1,000 0 |
| බී.—1 (සී) කම්කරු වැටුප් ... ... | 2,000 0 |
| ඩී.—5 ලී බඩු ... ... ... | 500 0 |
| ඊ.—2 (ඒ) වේතන ... ... | 3,000 0 |
| ඊ.—2 (බී) කරත්ත ගොනු හා ලොරි ... ... | 5,000 0 |
| එප්.—4 සතුකොට ගැනීම ... ... | 15,000 0 |
| එම්.—3 ලී බඩු ... ... ... | 500 0 |
| | 38,500 0 |
| ඊ.—5 (එච්) නානා ස්ථාන (73.05.08 දින යෝජනා අංක 14 හා සබඳි) ... ... ... | 250 0 |
| | 38,750 0 |

| අතිරේක මුදල් අවශ්‍ය වැය ශීර්ෂය | මුදල් රු. ශ. |
|---|---|
| ඒ. 1 (සී) කාර්යාල කාර්ය සහායකයින් ... ... | 1,600 0 |
| ඒ.—1 (ඊ) විශ්‍රාම වැටුප් ... ... ... | 3,000 0 |
| ඒ.—2 (ඒ) අතිරේක දීමනා ... ... | 500 0 |
| ඒ.—2 (බී) ගමන් වියදම් ... ... ... | 1,000 0 |
| ඒ.—2 (සී) බදු අයකරන්නන් සඳහා කොමිස් ... | 3,000 0 |
| ඒ.—2 (ජේ) දුම්රිය නිවාඩු බලපත්‍ර ... ... | 1,500 0 |
| ඒ.—2 (එල්) අතිකාල දීමනා ... ... | 1,500 0 |
| බී.—4 වීථි ආලෝක කිරීම ... ... | 12,000 0 |
| බී.—8 පාරවල් දියුණු කිරීම ... ... | 5,000 0 |
| ඩී.—1 වැටුප් ... ... ... | 1,000 0 |
| ඊ.—1 (එම්) මාතෘදරක ශුභ සාධනය ... ... | 500 0 |
| ඊ.—2 (එප්) උපකරණ සහ බෙහෙත් ... ... | 500 0 |
| ඊ.—3 (අයි) අතිකාල දීමනා ... ... | 1,000 0 |
| ඊ.—4 (ඒ) වේතන ... ... ... | 500 0 |
| ඊ.—4 (බී) නඩත්තු කිරීම ... ... | 200 0 |
| ඊ.—7 (බී) නඩත්තු කිරීම ... ... | 1,300 0 |
| ජී.—1 වේතන ... ... ... | 1,200 0 |
| අයි.—1 පරීක්ෂකවරුන්ට ගාස්තු ... ... | 500 0 |
| කේ.—1 ගිනිනාශක බඳුන් පිරවීම ... ... | 500 0 |
| එම්.—1 වේතන ... ... ... | 500 0 |
| එම්.—2 පොත්පත් සහ සඟරා ... ... | 1,200 0 |
| එම්.—4 නඩත්තු කිරීම හා දියුණු කිරීම ... ... | 500 0 |
| | 38,500 0 |
සුළු නගරසභා කාර්යාලය,
මුල්ලේරියාව,
අංගොඩ.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| 1. මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, රික්ෂෝ රථ පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන ඕනෑම අන්දමේ වාහනයක් සඳහා ... | 5 | 0 |
| 2. සෑම පාපැදියක්, රෝදත්‍රයේ පා පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්— | | |
| (අ) වෙළඳාම පිණිස පාවිච්චි කෙරේ නම් ... | 2 | 50 |
| (ආ) වෙළඳාම හැර වෙන කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 1 | 0 |
| 3. ගොන් දෙන්නා බැඳි සෑම බර කරත්තයක් හෝ තිරික් කලයක් සඳහා ... | 4 | 0 |
| 4. තනි ගොනා බැඳි බර බාගයක් හෝ තිරික්කලයක් සඳහා ... | 2 | 50 |
| 5. සෑම අත් කරත්තයක් සඳහා ... ... | 2 | 50 |
| 6. සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... | 2 | 50 |
| 7. සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ අශ්වතරයෙක් සඳහා ... ... ... | 5 | 0 |
| 8. සෑම ගොනෙක් හෝ බූරුවෙක් සඳහා ... | 1 | 0 |

10-672—73.1019 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

### මුල්ලේරියාව සුළු නගර සභාව

1974 වර්ෂය සඳහා යුනාබයින් ලියා පදිංචි කිරීමේ ගාස්තු

සුනාබයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත වන 477 වැනි අධිකාරයේ 4 වැනි කොටසේ ප්‍රකාර මුල්ලේරියාව සුළු නගර සභා සීමාව තුළ තබා ගන්නා සෑම බල්ලෙකුටම රු. 1 ක් හා සෑම බැල්ලියකටම රු. 1.50 බැගින් 1974 වර්ෂයට ලියා පදිංචි කිරීමේ ගාස්තු වශයෙන් පනවා ඇති බවත් එකී ගාස්තු 1974 මාර්තු මස 31 වැනිදා හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

නොයෙල් ගුණසේකර,
සභාපති,
මුල්ලේරියාව සුළු නගරසභාව.

1973 ඔක්තෝබර් 02 දින,
මුල්ලේරියාව සුළු නගරසභා කාර්යාලය,
මුල්ලේරියාව, අංගොඩ.

10-671—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

### මුල්ලේරියාව සුළු නගර සභාව

1974 වර්ෂයට දේපල බද්ද

සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය) යටතේ ගතවී යනු මෙම වර්ෂයට බලපවත්නා පහත සඳහන් දේපල බදු 1974 වර්ෂයටද එලෙසම පැනවීමට මුල්ලේරියාව සුළු නගරසභාව තීරණය කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටි සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හතර බැළින් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31 වැනිදායින්, ජූනි 30 වැනිදායින්, සැප්තැම්බර් 30 වැනිදායින් සහ දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන අයුරු කාර්තු වශයෙන් ගෙවිය හැකි වේ.

නොයෙල් ගුණසේකර,
සභාපති,
මුල්ලේරියාව සුළු නගර සභාව.

1973 ඔක්තෝබර් 02 දින,
සුළු නගරසභා කාර්යාලය,
මුල්ලේරියාව, අංගොඩ.

10-670—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

### වතුගෙදර සුළු නගර සභාව

විදුලිබල ගාස්තු ප්‍රතිශෝධනය කිරීම

වර්ෂ 1950 අංක 19 දරණ විදුලිබල පනතේ 36 වැනි ඡේදය හා වතුගෙදර සුළු නගර සභාවට නිකුත් කර ඇති වර්ෂ 1959 දෙසැම්බර් මස 2 වැනි දින දරණ විදුලිබල පත්‍රයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් 7 වැනි වගන්තිය ප්‍රකාර ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන විදුලි පරීක්ෂකතුමා වෙත පැවරී ඇති බලතල අනුව එතුමා විසින් එම බලපත්‍රයේ සඳහන් ගාස්තු පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇති බවත්, 1973 අගෝස්තු මස 1 වැනි දින සිට නව ගාස්තු ක්‍රමය ක්‍රියාත්මක වන බව මහජනයා වෙත මෙයින් දන්වමි.

ඇල්. සී. ද සිල්වා,
සභාපති,
සුළු නගර සභාව, වතුගෙදර.

1973 අගෝස්තු මස 24 වැනි දින,
වතුගෙදර සුළු නගර සභා කාර්යාලයේ දිය.

ගාස්තු වක්‍රය

**වැඩිම මිළ හා අය කිරීමේ ක්‍රම**

ගාස්තු අංක 1 (පහන් පංකා හා පොදු කටයුතු සඳහා)

1. **මාසික පරිහරණය.**—
   - පළමුවන ඒකක 300 ඒකකයක් ශත 55 බැගින්
   - දෙවන ඒකක 250 ඒකකයක් ශත 50 බැගින්
   - තෙවන ඒකක 250 ඒකකයක් ශත 45 බැගින්
   - ඒකක 800 ට අමතරව සෑම ඒකකයක්ම ශත 40 බැගින්

2. අඩුම අය කිරීම මසකට රු. 6 බැගින් (මනු කුලිය හැර).

3. මනු කුලිය මසකට රු. 1 බැගින්.

ගාස්තු අංක 2 (ගාමක බලය සඳහා හෝ විද්‍යුත් රසායනික) (නැතහොත් විද්‍යුත් තාප ක්‍රියා සඳහා)

1. **මාසික පරිහරණය.**—
   - පළමුවන ඒකක 500 ඒකකයක් ශත 27 බැගින්
   - දෙවන ඒකක 300 ඒකකයක් ශත 25 බැගින්
   - තෙවන ඒකක 200 ඒකකයක් ශත 23 බැගින්
   - ඒකක 1,000 ට අමතරව සෑම ඒකකයක්ම ශත 21 බැගින්

2. අඩුම අය කිරීම මසකට රු. 6 බැගින් (මනු කුලිය හැර) නැතහොත් නිර්ණිත අවශ්‍යතාවේ කි. වෝ. ඈ. එකක් හෝ ඉන් කොටසක් හෝ සඳහා රු. 1 බැගින් යන දෙකින් වැඩි ගණන.

3. මනු කුලිය මසකට රු. 1 බැගින්

ගාස්තු අංක 3 (බාහිර පහන් සංඥා සිනමාහල් හා නාට්‍යශාලා සඳහා)

1. **මාසික පරිහරණය.**—
   - පළමුවන ඒකක 500 ඒකකයක් ශත 35 බැගින්
   - දෙවන ඒකක 300 ඒකකයක් ශත 33 බැගින්
   - තෙවන ඒකක 200 ඒකකයක් ශත 31 බැගින්
   - ඒකක 1,000 අමතරව සෑම ඒකකයක්ම ශත 29 බැගින්

2. අඩුම අය කිරීම මසකට රු. 6 බැගින් හෝ (මනු කුලිය හැර) නැත හොත් නිර්ණිත අවශ්‍යතාවේ කි. වෝ. ඈ. එකක් හෝ ඉන් කොටසක් හෝ සඳහා රු. 1 බැගින් යන දෙකින් වැඩි ගණන.

3. මනු කුලිය මසකට රු. 1 බැගින්.

ගාස්තු අංක 4 (ගෘහිය කටයුතු සඳහා)

1. සැපයුම මනුගත කොට දෙකොටස් ගාස්තු ක්‍රමයකට අනුව අය කෙරෙනු ඇත. ස්ථාවර ගාස්තුව වෙනුවෙන් පහත සඳහන් උපලේඛනය අනුව පිළියෙල කළ ගාස්තුවකින්ද සියළුම කටයුතු සඳහා පරිහරණය කරන ලද ඒකක සඳහා ඒකකයක් ශත 14 බැගින්වූ ඒකක ගාස්තුවකින්ද මෙම දෙකොටස් ගාස්තු ක්‍රමය සමන්විත වන්නේය.

2. ස්ථාවර ගාස්තුව (මනු කුලියත් ඇතුළුවයි)—
   - වර්ග අඩි 1,500 ට නොවැඩි නම් මසකට රු. 6 බැගින්
   - වර්ග අඩි 1,750 ට නොවැඩි නම් මසකට රු. 7 බැගින්
   - වර්ග අඩි 2,000 ට නොවැඩි නම් මසකට රු. 8 බැගින්
   - වර්ග අඩි 2,250 ට නොවැඩි නම් මසකට රු. 9 බැගින්
   - වර්ග අඩි 2,500 ට නොවැඩි නම් මසකට රු. 10 බැගින්
   - වර්ග අඩි 3,000 ට නොවැඩි නම් මසකට රු. 11 බැගින්
   - වර්ග අඩි 3,500 ට නොවැඩි නම් මසකට රු. 12 බැගින්
   - වර්ග අඩි 4,000 ට නොවැඩි නම් මසකට රු. 13 බැගින්
   - වර්ග අඩි 4,500 ට නොවැඩි නම් මසකට රු. 14 බැගින්
   - වර්ග අඩි 5,000 ට නොවැඩි නම් මසකට රු. 15 බැගින්
   - වර්ග අඩි 5,500 ට නොවැඩි නම් මසකට රු. 16 බැගින්
   - වර්ග අඩි 6,000 ට නොවැඩි නම් මසකට රු. 17 බැගින්
   - වර්ග අඩි 6,500 ට නොවැඩි නම් මසකට රු. 18 බැගින්
   - වර්ග අඩි 7,000 ට නොවැඩි නම් මසකට රු. 19 බැගින්
   - වර්ග අඩි 8,000 ට නොවැඩි නම් මසකට රු. 20 බැගින්
   - වර්ග අඩි 9,000 ට නොවැඩි නම් මසකට රු. 21 බැගින්
   - වර්ග අඩි 10,000 ට නොවැඩි නම් මනකට රු. 22 බැගින්

සෑම අතිරේක වර්ග අඩි 2,000කට හෝ ඉන් කොටසකට මසකට රු. 1 බැගින්

### වැලිමඩ සුළු නගර සභාව

1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වැනි ව්‍යවස්ථාව යටතේ වැලිමඩ සුළු නගර සභාව විසින් සම්මතකළ පහත සඳහන් යෝජනාව එකී වගන්තිය ප්‍රකාර ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**යෝජනාව**

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1954 මාර්තු මස 26 දින අංක 10,657 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු අතුරු ව්‍යවස්ථාවල 15 සහ 16 වැනි කාණ්ඩ මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට වැලිමඩ සුළු නගර සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ඩබ්ලිව්. අමාරිස් සිල්වා,
සභාපති.

1973 ඔක්තෝබර් මස 8 වැනි දින,
වැලිමඩ සුළු නගර සභා කාර්යාලයේදීය.

10–699—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

### කහවත්ත නගරය

සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය)
**1974 වර්ෂය සඳහා දේපල බද්ද**

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනත යටතේ ගතවී යන මෙම වර්ෂයට බලපවත්නා පහත සඳහන් බදු 1974 වර්ෂයටද එලෙසම පැනවීමට කහවත්ත නගරයේ විශේෂ කොමසාරිස්වරයා තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 (2) වැනි වගන්තිය ප්‍රකාර මෙම නගරය තුළ පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31 වැනි දායින්, ජූනි 30 වන දායින්, සැප්තැම්බර් 30 වන දායින් සහ දෙසැම්බර් 31 වන දායින් අවසන් වන අයුරු කාර්තු වශයෙන් ගෙවිය හැකි වේ.

ආර්. කේ. එච්. ඇම්. ප්‍රනාන්දු,
විශේෂ කොමසාරිස්—කහවත්ත නගරය.

1973 සැප්තැම්බර් මස 04 දින,
කහවත්ත විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

10–538/1—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

### කහවත්ත නගරය

256 වැනි අධිකාරය වන උප නගර සභා ආඥාපනත

**1974 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද**

කහවත්ත නගරයේ විශේෂ කොමසාරිස් විසින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) 256 වැනි අධිකාරය වන උප නගර සභා ආඥාපනතේ අංක 161 (1) දරණ වගන්තිය යටතේ පහත උපලේඛනය විස්තර වන ගණන් අනුව 1974 අවුරුද්දට රථවාහන හා සතුන් සඳහා බද්දක් පනවා අයකිරීමටද,

(2) එකී ආඥාපනතේ 162 (3) වැනි වගන්තිය යටතේ එකී බදු 1974 මාර්තු 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගෙවියහැකි අයුරින්ද වේ.

ආර්. කේ. එච්. ඇම්. ප්‍රනාන්දු,
විශේෂ කොමසාරිස්—කහවත්ත නගරය.

1973 සැප්තැම්බර් මස 04 දින,
කහවත්ත විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | රු. | ශ. |
|---|---|---|---|
| මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, මෝටර් ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි, හැර වෙනයම් ඕනෑම වාහනයක් සඳහා | ... | 5 | 0 |
| හැම පාපැදියක්ම, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්— | | | |
| (ඒ) වෙළඳාම සඳහා පාවිච්චි කරනු ලබන්නේ නම් | ... | 5 | 0 |
| (බී) වෙළඳාම හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන්නේ නම් ... | ... | 1 | 0 |
| සෑම ගොන් බඳින කරත්තයක් සඳහා | ... | 4 | 0 |
| සෑම අත් කරත්තයක් සඳහා | ... | 4 | 0 |
| සෑම ජින් රික්ෂෝවක් සඳහා ... | ... | 2 | 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටලුවකුට | ... | 5 | 0 |
| සෑම බූරුවකුට හෝ ගොනෙකුට | ... | 1 | 0 |

10–538/2—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

### කහවත්ත නගරය

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි අධිකාරය)

**1974 වර්ෂයට සුනඛයින් ලියා පදිංචි කිරීමේ ගාස්තු**

477 අධිකාරය වන සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 4 වැනි වගන්තියේ ප්‍රකාර කහවත්ත නගරය තුළ තබා ගෙන සිටින සෑම පිරිමි සුනඛයෙක් සඳහා රුපියල් 1 බැගින්ද, ගැහැණු සුනඛයෙක් සඳහා රුපියල් 1.50 බැගින් ද, 1974 මාර්තු 31 වැනිද හෝ ඊට ප්‍රථම ගෙවන අයුරින් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් 1974 වර්ෂයට අයකිරීමට පනවා ඇති බව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආර්. කේ. එච්. ඇම්. ප්‍රනාන්දු,
විශේෂ කොමසාරිස්—කහවත්ත නගරය.

1973 සැප්තැම්බර් මස 04 දින,
කහවත්ත විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

10–538/3—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

### ලුණුගල සුළු නගර සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනත**

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම සඳහා, 1974 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලා තිබෙන බවත් මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධව, ලුණුගල සුළු නගර සභා සීමාව තුල පදිංචි ඕනෑම අයෙකුට, ඒ සඳහා තමා විරුද්ධ වන්නේ අසවල් කාරණා නිසායයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින දහ හතරක් ඇතුලත, මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, (272 අධිකාරය වන) ගෝඝාතක ආඥා පනතේ 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

**උපලේඛනය**

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | | ස්ථානය | වෙළඳාම |
|---|---|---|---|
| ඒ. එච්. පාරුක් මහතා, අංක 98, මඩකලපුව පාර, ලුණුගල | ... | ලුණුගල සුළු නගර සභා පොදු වෙළඳපළේ අංක 1 දරණ කඩ කාමරය | ගවමස් |

ඩී. වී. ඩී. වීරසේකර,
සභාපති,
සුළු නගර සභාව, ලුණුගල.

1973 ඔක්තෝබර් මස 5 වැනි දින,
ලුණුගල සුළු නගර සභා කාර්‍යාලයේදී ය.

10–562—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

**විශේෂ කොමසාරිස් කායර්‍ාලය—මොණරාගල නගරය**

රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද—1974 වර්‍ෂය

මොණරාගල නගරයේ විශේෂ කොමසාරිස් විසින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) සුළු නගර සභා ආඥපනතේ (256 වැනි අධිකාරය) අංක 161 දරණ වගන්තිය යටතේ පහත දැක්වෙන උපලේඛනයේ විස්තර වන ගණන් අනුව 1974 වර්‍ෂයට රථ වාහන හා සතුන් සඳහා බද්දක් පනවා අයකිරීමට තීරණය කර ඇති බවද,

(2) එකී ආඥපනතේ 162 (3) යටතේ එකී බදු 1974 මාර්තු මස 31 වෙනි දිනට හෝ ඊට පෙර ගෙවිය යුතු බවද වේ.

පී. බී. වර්සකෝන්,
විශේෂ කොමසාරිස්, මොනරාගල නගරය.

1973 ඔක්තෝබර් මස 08 දින,
මොනරාගල,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

**උපලේඛනය**

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, මෝටර් ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන යම් ඕනෑම අන් දමේ වාහනයක් සඳහා ... | 5 | 0 |
| සෑම පාපැදියක් හෝ රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි රථයක් හෝ කරත්තයක්— | | |
| (අ) වෙළඳාම සඳහා පාවිච්චි කෙරේ නම් ... | 5 | 0 |
| **(ආ) වෙළඳාමට හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම්** ... | 1 | 0 |
| ගොන් දෙන්නා බඳින සෑම බර කරත්තයක් හෝ තිරික් කලයක් සඳහා ... ... | 4 | 0 |
| තනි ගොනා බඳින සෑම බර කරත්තයක් හෝ තිරික් කල යක් සඳහා ... ... ... | 3 | 0 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... | 2 | 50 |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... ... | 2 | 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටළුවෙක් සඳහා ... | 5 | 0 |
| සෑම ගොනෙකුට හෝ බූරුවෙකුට ... ... | 1 | 0 |

10–754/1—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

**විශේෂ කොමසාරිස් කායර්‍ාලය—මොනරාගල නගරය**

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥපනත—(477 වැනි අධිකාරය)

**1974 වර්ෂය සඳහා සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු**

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥපනත වන 477 වන අධිකාරයේ 4 වැනි වගන්තියේ ප්‍රකාර මොනරාගල සුළු නගර සභා සීමාව තුළ තබා ගන්නා සෑම බල්ලෙකුට රුපියල් 1ක් සහ සෑම බැල්ලිය කට රුපියල් 1.50ක් බැගින්, 1974 වර්ෂයට ලියාපදිංචි කිරීමේ ගාස්තු පනවා ඇති බවත්, එකී ගාස්තු 1974 මාර්තු 31 දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. බී. වර්සකෝන්,
විශේෂ කොමසාරිස්, මොනරාගල නගරය.

1973 ඔක්තෝබර් මස 08 දින,
මොනරාගල,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

10–754/2—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

**විශේෂ කොමසාරිස් කාර්යාලය—මොනරාගල නගරය**

කැලි කසළ ඉවත් කිරීමේ ගාස්තු—1974 වර්ෂය

සුළු නගර සභා ආදර්ශ අතුරු ව්‍යවස්ථා මාලාවේ 20 වෙනි කොටසේ 4 වෙනි නියෝගයේ ප්‍රකාර, කැළි කසළ ඉවත් කිරීමේ සේවා පවත්වා ගෙන යනු ලබන සීමා තුළ කුණු බාල්දි තැබීමට නියම කර ඇති සෑම ස්ථානයකම එක් කුණු බාල්දියක් ඉවත් කිරීම වෙනුවෙන් මස කට ශත 25 බැගින් වූ ගාස්තුවක් පනවා අය කිරීමට තීරණය කරන ලද බව මෙයින නිවේදනය කරනු ලැබේ.

පී. බී. වර්සකෝන්,
විශේෂ කොමසාරිස්, මොනරාගල නගරය.

1973 ඔක්තෝබර් මස 08 දින,
මොනරාගල,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

10–754/3—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

**විශේෂ කොමසාරිස් කාර්යාලය—මොනරාගල නගරය**

වැසිකිළි ගාස්තු—1974 වර්ෂය

මොනරාගල සුළු නගර සභා ප්‍රදේශය තුළ විධිමත් ව අසූචි ඉවත් කිරීමේ සේවාවක් පවත්වාගෙන යනු ලබන සීමාවන්ගෙන් පිටත තිබෙන, සෑම බාල්දියක් තබන වැසිකිළියක, එක බාල්දියක් වෙනු වෙන් සුළු නගර සභා ආදර්ශ අතුරු ව්‍යවස්ථා මාලාවේ 19 වෙනි කොටසේ 6 වෙනි නියෝගය ප්‍රකාර මසකට රුපියල් 2.50 බැගින් වූ ගාස්තුවක් පනවා අය කිරීමට තීරණය කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

පී. බී. වර්සකෝන්,
විශේෂ කොමසාරිස්, මොනරාගල නගරය.

1973 ඔක්තෝබර් මස 08 දින,
මොනරාගල,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

10–754/4—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

**ගොකරැල්ල ගම් සභාව**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නම් සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම 1974 වර්ෂය සඳහා බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව ගොකරැල්ල ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, තමා එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක් එවීමට බලය තිබෙන බවත්, එකී ලියවිල්ල මෙම දන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට දින 14ක් ඇතුලත එවිය යුතු බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වන අධිකාරය) අංක 7 දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම් කිරීමට අදහස් කරන ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. ඇම්. එච්. ඇම්. සාඩ්ලීන්, ෂම් ෂම් ස්ටෝර්ස්, දඹුලු පාර, මැල්සිරිපුර ... | මැල්සිරිපුර අංක 303 දරණ ගොඩනැගිල්ලේ ... | එළ හරක් මස් |
| 2. ඇම්. ඇස්. ඇම්. රාෆීක්, අලව්දීන් සමාගම බාරේ, ගොකරැල්ල ... | ගොකරැල්ල ගම්සභාවට අයිති කඩකාමරය ... | එළ හරක් මස් |

සී. ආර්. අමරසිංහ,
පාලන නිළධාරි, ගොකරැල්ල ගම් ප්‍රදේශය.

1973 ඔක්තෝබර් මස 05 වැනි දින,
ගොකරැල්ල ගම්සභා කායර්‍ාලය,
ගොකරැල්ල දී ය.

10–592—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

**කැළණිය සුළු නගර සභාව**

1974 වර්ෂය සඳහා වරිපනම් බදු

256 වන අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත යටතේ 1973 වර්ෂයට පනවා තිබූ වරිපනම් බදු 1974 වර්ෂයට ද එලෙසම මෙම නගර සභා සීමාව තුළ පැනවීමට කැළණිය සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ 159 වැනි වගන්තිය ප්‍රකාර මෙම නගර සීමාව තුළ පිහිටා ඇති කුඹුරු හා තණකොළ කොටු හැර, සියළුම නිශ්චල දේපලවල වටිනාකමෙන් සියයට හයක් (6%) වූ වාර්ෂික වරිපනම් බදු පිළිවෙලින් 1 වෙනි හා 2 වෙනි කාර්තු ජූනි 30 වැනිදැයින්, 3 වෙනි කාර්තුව සැප්තැම්බර් 30 වැනිදැයින් සහ 4 වෙනි කාර්තුව දෙසැම්බර් 31 වැනිදැයින් අවසන් වන අයුරු ගෙවිය හැකිවේ.

ඩබ්ලියු. කේ. ඩී. සිරිසේන,
සභාපති,
කැළණිය සුළු නගර සභාව.

1973 ඔක්තෝබර් මස 5 වෙනි දින,
කැළණිය සුළු නගර සභා කාර්යාලයේදීය.

10–742—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

**කැළණිය සුළු නගර සභාව**

සුළු නගර සභා ආඥාපනත (256 වෙනි පරිච්ඡේදය)

**1974 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද**

කැළණිය සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

1. සුළු නගර සභා ආඥාපනතේ (256 වෙනි පරිච්ඡේදය) අංක 161 දරණ වගන්තිය යටතේ පහත උපලේඛනයේ එම වාහන සහ සතුන් ඉදිරියෙන් සඳහන් කර තිබෙන ගණන් අනුව එම වාහන සතුන් පිළිබඳ බද්දක් ගෙවිය යන 1973 වර්ෂයට මෙන්ම 1974 වර්ෂයට ද පනවා ඇති බව; සහ

2. යථෝක්ත ආඥාපනතේ 162 (3) වෙනි වගන්තිය යටතේ එකී බදු 1974 මාර්තු මස 31 වෙනිදා හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් ය.

ඩබ්ලියු. කේ. ඩී. සිරිසේන,
සභාපති,
කැළණිය සුළු නගර සභාව.

**උපලේඛනය**

| | රු. | ශත |
|---|---|---|
| සෑම පාපැදියක්— | | |
| (අ) වෙළඳාම පිණිස කෙරේ නම් ... | 2 | 0 |
| (ආ) වෙළඳාමට හැර වෙන කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... ... ... | 1 | 0 |
| (ඇ) සෑම කරත්තයක් හෝ රික්ෂෝ රථයක් සඳහා | 2 | 0 |
| (ඈ) තනි ගොනා බැඳි සෑම බරබාගයක් හෝ තිරික් කලයක් සඳහා ... ... | 2 | 50 |
| (ඉ) ගොන් දෙන්නා බැඳි සෑම බරකරත්තයක් හෝ තිරික් කලයක් සඳහා ... ... | 5 | 0 |
| (ඊ) අශ්වයකු සඳහා ... | 5 | 0 |
| (උ) අලියකු හෝ ඇතෙකු සඳහා ... ... | 10 | 0 |

10–744/1—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

**කැළණිය සුළු නගර සභාව**

1974 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

**සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වෙනි අධිකාරය)**

477 වන අධිකාරය වන සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 4 වන වගන්තියේ ප්‍රකාර කැළණිය සුළු නගර සභා බල මණ්ඩලය තුළ නඩාගෙන සිටින සෑම පිරිමි සුනඛයෙක් සඳහා රුපියල් 1.00 බැගින් ද ගැනු සුනඛයෙක් සඳහා රු. 1.50 බැගින් ද 1974 ජූනි මස 1 වෙනි දා හෝ ඊට පෙර ගෙවන අයුරින් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් 1974 වර්ෂය සඳහා අයකිරීමට පනවා ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩබ්ලියු. කේ. ඩී. සිරිසේන,
සභාපති,
කැළණිය සුළු නගර සභාව.

10–744/2—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

**නාරම්මල ගම්සභාව—කුරුණෑගල දිස්ත්‍රික්කය**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් එහි දැක්වෙන ස්ථානයෙහි 1974 වර්ෂයට සතුන් මැරීම සඳහා බලපත්‍ර ඉල්ලා ඇති බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල ගම්සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම් එය විස්තර සහිත ලියවිල්ලකින් පිටපත් දෙකකින් යුක්ත වනසේ සකස් කොට, මෙම දැන්වීම ගැසට් පත්‍රයෙහි පළවන දින සිට දින 14ක් ඇතුලත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥාපනතේ 272 වෙනි පරිච්ඡේදයේ 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| එම්. වයි. මොහමඩ්, රම්මුතුගල, නාරම්මල ... | නුගගහගෙදර, පී. ඒ. අබුරා ලෙබ්බෙ මයා. සතු 'පාදිලි' වත්ත... | මස් පිණිස එළහරක් මැරීම |

ආර්. ඇම්. කිරිබණ්ඩා,
නාරම්මල ගම්සභාවේ සභාපතිතැන.

1973 ඔක්තෝබර් මස 06 වෙනි දින,
නාරම්මල ගම්සභා කාර්යාලයේ දීය.

10–695/1—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

### නාරම්මල ගම්සභාව—කුරුණෑගල දිස්ත්‍රික්කය

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි නම් සඳහන් අය විසින් එහි දැක්වෙන ස්ථානයන්හි 1974 වර්ෂය සඳහා මස් කඩ පවත්වාගෙනයාමට බලපත්‍ර ඉල්ලුම් කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල ගම්සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම්, එය විස්තර සහිත ලියවිල්ලකින් පිටපත් දෙකකින් යුක්තවන සේ සකස් කොට මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුලත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥාපනතේ 272 වෙනි පරිච්ඡේදයේ 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| එම්. වයි. මොහමඩ්, රම්මුතුගල, නාරම්මල ... ... ... | කඩහපොල, මාරගහමුල වත්ත ... | එළහරක් මස් |
| ඒ. බාවාකනී, ගැටකහට, පහමුනේ ... ... ... | පහමුනේ, අඹගහමුලහේන ... | එළහරක් මස් |

ආර්. ඇම්. කිරිබණ්ඩා,
නාරම්මල ගම්සභාවේ සභාපති තැන.

1973 ඔක්තෝබර් මස 06 වෙනි දින,
නාරම්මල ගම්සභා කාර්යාලයේ දීය.

10–695/2—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

### කෝට්ටේ–ගල්කිස්ස ගම්සභාව

#### මස් පිණිස සතුන් මරන්න පිළිබඳ ආඥාපනත යටතේ දැන්වීම

මෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන අය විසින් මස් විකිණීම සඳහා 1974 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, එම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව කෝට්ටේ–ගල්කිස්ස ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුණ නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වන අධිකාරයේ අංක 7 දරණ වගන්තියේ ප්‍රකාර මෙයින් දනුම් දෙමි.

උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|---|
| 1. | ඩබ්. පී. ඇම්. බෙනඩික් පෙරේරා මහතා, 261, උස්වත්ත, රවුම් පාර, මොරටුව ... | 226, දෙහිවල පාර, බොරලැස්ගමුව ... | හරක් මස් |
| 2. | ඇම්. ඇන්. ඇම්. මොහමඩ් නියාස් මහතා, 35, දිගරොල්ල, මොරටුව ... | 126, හයිලෙවල් පාර, පන්නිපිටිය ... | හරක් මස් |

ඕ. විජයදාස පෙරේරා,
කෝට්ටේ–ගල්කිස්ස ගම්සභාවේ සභාපති.

1973 ඔක්තෝබර් 3 වැනි දින,
බොරලැස්ගමුවේ, කෝට්ටේ–ගල්කිස්ස ගම්සභා කාර්යාලයේ දීය.

10–600—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

### මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ගඟ පළාත උතුර ගම් සභාව

#### ගම්සභා ආඥාපනත (257 වන අධිකාරය)

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා විසින් සම්පාදිතව, අංක 15,001 සහ 1973. 03. 10 දින රජයේ ගැසට් පත්‍රයේ IV වන කොටසේ ප්‍රකාශයට පමුණුවන ලද අතුරු ව්‍යවස්ථාවල උපලේඛනයේ 1 වැනි, 2 වැනි හා 3 වැනි කොටස්වල සඳහන් "අන්තරාදායක", "අප්‍රසන්න" සහ "අන්තරාදායක හා අප්‍රසන්න" ව්‍යාපාරවල් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට පටන් මෙම. මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ගඟ පළාත උතුර ගම් සභා බල ප්‍රදේශය තුළ ද ඒ අයුරින්ම ක්‍රියාත්මක කරනු ලබන බව මෙයින් ප්‍රකාශයට පමුණුවනු ලැබේ.

ඩී. ජේ. විමලරත්න,
උඩුනුවර ගඟ පළාත උතුර ගම් සභාවේ සභාපති.

උඩුනුවර ගඟ පළාත උතුර ගම් සභා කාර්යාලය,
කොස්සින්න, ගෙලිඔය,
1973ක් වූ ඔක්තෝබර් මස 04 වන දින දීය.

10–563—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

### මහනුවර දිස්ත්‍රික්කයේ පා. දූ. පලිස්පත්තුව බටහිර ගම්සභාව

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් තැනැත්තන් විසින් එකී නම් ඉදිරියෙහි දැක්වෙන ස්ථානයන්හි 1974 වර්ෂය තුළ මස් කඩ පවත්වාගෙනයාම සඳහා බලපත්‍ර ඉල්ලුම්කර ඇති බැවින්, එම බලපත්‍රකරුවන්ට 1974 වර්ෂයට බලපත්‍ර නිකුත් කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ පා. දූ. පලිස්පත්තුව බටහිර ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම අයෙකු විරුද්ධවනුයේ නම් එම විරුද්ධත්වය විස්තර සහිතව ලියවිල්ලක් මඟින් පිටපත් දෙකකින් යුතුව සකස් කොට මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරිය) 7 වන වගන්තිය ප්‍රකාර මෙයින් දනුම් දෙනු ලැබේ.

උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | වෙළඳාමේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|---|
| (1) | ඒ. බුහාරි, උඩුදැකඩ, තෙල්දෙනිය ... ... ... ... | එළු මස් ... | උඩුදැකඩ, තෙල්දෙනිය |
| (2) | එස්. හලල්දීන්, උඩුදැකඩ, තෙල්දෙනිය ... ... ... | එළ ගව මස් ... | උඩුදැකඩ, තෙල්දෙනිය |
| (3) | එන්. මුහම්මදු හනීපා, දිගන, කෙන්ගල්ල ... ... ... | එළ ගව මස් ... | උඩුදැකඩ, තෙල්දෙනිය |
| (4) | ඒ. ඇම්. හාසිම්, කුඹුක්කඳුර, තෙල්දෙනිය ... ... ... | එළ ගව මස් ... | දිගනතැන්නහේන, දිගන |

ඇම්. ජේ. බී. ඒකනායක,
සභාපති,
පා. දූ. පලිස්පත්තුව බටහිර ගම්සභාව.

1973 ඔක්තෝබර් මස 09 වැනි දින,
දිගන, කෙන්ගල්ල,
පා. දූ. පලිස්පත්තුව බටහිර ගම්සභා කාර්යාලයේ දීය.

10–748—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

**1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනත (261 වැනි අධිකාරය)**

හිඟුරාන ගම්සභාව

පළාත් පාලන ආයතන "පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා" පනතේ 3 වැනි වගන්තිය යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ හිඟුරාන ගම්සභාවේ පාලන නිලධාරි විසින් ගෙන ඇති පහත දැක්වෙන තීරණය එකී වගන්තියේ ප්‍රකාර මෙහි පළ කරනු ලැබේ.

**තීරණය**

පළාත් පාලන අමාත්‍ය තුමා විසින් සම්පාදනය කරනු ලැබ 1953 අප්‍රියෙල් මස 10 වන දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දා වූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වෙනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දා වූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට 37 දක්වා වූ කාණ්ඩද (අංක 1 සහ 37 වැනි කාණ්ඩ දෙකම ඇතුලත්ව),

පළාත් පාලන අමාත්‍ය තුමා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දා වූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 ජනවාරි මස 8 වන දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දා වූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වැනි කාණ්ඩයද,

පළාත් පාලන අමාත්‍ය තුමා විසින් සම්පාදනය කරනු ලැබ 1966 ජූලි මස 8 වැනි දින අංක 14,703 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දා වූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1969 ජනවාරි මස 3 වැනි දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දා වූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 39 සිට 41 දක්වා වූ කාණ්ඩද (අංක 39 සහ 41 වැනි කාණ්ඩ දෙකම ඇතුළත්ව),

1972 නොවැම්බර් මස 3 වැනි දින අංක 32 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ අංක 42 දරණ කොටසේ සඳහන් පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවද, මෙම තීරණය ගැසට් පත්‍රයේ පළවූ දින සිට ක්‍රියාත්මක වන අන්දමින් පිළිගැනීමට අම්පාර දිස්ත්‍රික්කයේ හිඟුරාන ගම්සභාවේ පාලන නිලධාරි විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙසින් තීරණය කරනු ලැබේ.

බී. එම්. එස්. වැගපිටිය,
පාලන නිලධාරි, හිඟුරාන ගම්සභාව.

1973 ඔක්තෝබර් මස 10 වන දින,
හිඟුරාන ගම්සභා කාර්යාලයේ දීය.

10–750—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

**1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනත (261 වැනි අධිකාරය)**

වඩිනාගල ගම්සභාව

පළාත් පාලන ආයතන "පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා" පනතේ 3 වැනි වගන්තිය යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ වඩිනාගල ගම්සභාවේ පාලන නිලධාරි විසින් ගෙන ඇති පහත දැක්වෙන තීරණය එකී වගන්තියේ ප්‍රකාර මෙහි පළ කරනු ලැබේ.

**තීරණය**

පළාත් පාලන අමාත්‍ය තුමා විසින් සම්පාදනය කරනු ලැබ 1953 අප්‍රියෙල් මස 10 වන දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දා වූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වෙනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දා වූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට 37 දක්වා වූ කාණ්ඩද (අංක 1 සහ 37 වැනි කාණ්ඩ දෙකම ඇතුලත්ව),

පළාත් පාලන අමාත්‍ය තුමා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දා වූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 ජනවාරි මස 8 වන දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දා වූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වැනි කාණ්ඩයද,

පළාත් පාලන අමාත්‍ය තුමා විසින් සම්පාදනය කරනු ලැබ 1966 ජූලි මස 8 වැනි දින අංක 14,703 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දා වූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1969 ජනවාරි මස 3 වැනි දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දා වූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 39 සිට 41 දක්වා වූ කාණ්ඩද (අංක 39 සහ 41 වැනි කාණ්ඩ දෙකම ඇතුලත්ව),

1972 නොවැම්බර් මස 3 වැනි දින අංක 32 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ අංක 42 දරණ කොටසේ සඳහන් පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවද, මෙම තීරණය ගැසට් පත්‍රයේ පළවූ දින සිට ක්‍රියාත්මක වන අන්දමින් පිළිගැනීමට අම්පාර දිස්ත්‍රික්කයේ වඩිනාගල ගම්සභාවේ පාලන නිලධාරි විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙසින් තීරණය කරනු ලැබේ.

බී. එම්. එස්. වැගපිටිය,
පාලන නිලධාරි, වඩිනාගල ගම්සභාව.

1973 ඔක්තෝබර් මස 10 වන දින,
වඩිනාගල ගම්සභා කාර්යාලයේ දීය.

10–749—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

**පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් (261 වැනි අධිකාරය) පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පණතේ 2 වැනි වගන්තිය ප්‍රකාර 1972 මාර්තු මස 10 වැනි දින අංක 15,001 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද සංශෝධිතයට දක්වන XVIII වැනි කාණ්ඩය පිළිගැනීමටත්, එය ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවන දින සිට පින්නවල ගම් සභා ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමටත්, 1973.09.28 වෙනි දින රැස්වීමේදී සභා සම්මතවූ බව මෙයින් දන්වමි.

ආරියනන්ද සමරසිංහ,
පින්නවල ගම්සභාවේ සභාපති.

1973.10.10 වෙනි දින,
රඹුක්කන,
පින්නවල ගම්සභා කාර්යාලයේ දීය.

අතුරු ව්‍යවස්ථා

කලින් කල සංශෝධනය කරන ලද පරිදිවූ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයෙහි පළකරණ ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XVIII වැනි කොටසෙහි අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාළ අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි වැඩි දුරටත් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අලුත් ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

1. "මෙම අතුරු ව්‍යවස්ථාවල" අන්තරාදායක හෝ අප්‍රසන්න ව්‍යාපාර යන්නෙන් මෙහිවූ උපලේඛනයෙහි අවස්ථාවෝචිත පරිදි I වැනි කොටසේ, II වැනි කොටසේ හෝ III වැනි කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස්වේ" තවද,

(2) එම කොටසෙහි අවසානයට පහත දැක්වෙන උපලේඛනයට අන්තර්ගත කිරීමෙන් :—

උපලේඛනය

I කොටස

**අන්තරාදායක ව්‍යාපාර**

කබුක්, බොරළු හෝ කලුගල් කැනීම.

කබුක්, බොරළු හෝ කලුගල් ගබඩා කිරීම.

සිසිල් බීම නිෂ්පාදනය කිරීම.

ග්‍රෝස් එකකට වැඩි ප්‍රමාණයක් සිසිල් බීම බෝතල් ගබඩාකර තබා ගැනීම.

අයිස් නිපදවීම.

කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එළවළු තෙල් නිශ්කර්ශණය.

ගැලුම් 50 ට වැඩි ප්‍රමාණයක පොත්තෙල් ගබඩාකර තබා ගැනීම.

පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක ගැලුම් 12 ට වැඩි ප්‍රමාණයක් ගබඩාරක තබා ගැනීම.

ගිනි පෙට්ටි නිෂ්පාදනය.

ග්‍රොස් 10 ට වඩි ප්‍රමාණයක ගිනි පෙට්ටි ගබඩාකර තබා ගැනීම.

ඉඹුල් පුලුන් හෝ කපු හෝ කපු පුලුන් ගබඩාකර තබා ගැනීම.

මැතිලේටඩ් ඉස්ප්‍රිතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම.

තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

කොහු හෝ වෙනත් කෙඳිවර්ග නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.

කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් සාදනු ලබන භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

පිදුරු ගබඩා කර තබා ගැනීම.

පාවිච්චිකළ ඇඳුම් ගබඩාකර තබා ගැනීම.

කුළියට දීම සඳහා ලාම්පු ගබඩාකර තබා ගැනීම.

ධාන්‍ය හෝ මාෂ භෝග හොන්ඩර 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත් වැඩියා කිරීම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම.

අතින් ලී ඉරන ඉරුම් වලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යාම.

දැව ගබඩාවක් පවත්වාගෙනයාම.

දර ගබඩාවක් පවත්වාගෙනයාම.

ගිරි ගල් හෝ හුණුගල් සඳහා හෑරීම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි කරණ කම්හලක් පවත්වාගෙනයාම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකරන කම්හලක් පවතාවාගෙනයාම.

තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හොණ්ඩර 15 කට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

ගිස් බෝතල් හෝ ගිස් ගෝනි ගබඩාකර තබා ගැනීම.

බයිසිකල් හෝ මෝටර් සයිකල් අලුත්වැඩියා කිරීම සඳහා වැඩ පළක් පවත්වාගෙනයාම.

අලුත් හෝ පාවිච්චි කරණ ලද රබර් ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොණ්ඩර 1 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

පොල් කටු ගබඩාකර තබා ගැනීම.

පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි හෝ ගබඩාකර තබා ගැනීම.

විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටින්) සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.

අත්යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ විවීම.

අත්යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම.

සිල්ක් සහ කෘත්‍රිම රෙදි විවීම හා විසිතුරු කිරීම.

මැසූ ඇඳුම් නිෂ්පාදනය.

මුද්‍රණාලයක් පවත්වාගෙනයාම.

## II වැනි කොටස

### අප්‍රසන්න ව්‍යාපාර

මිනිරන් සුද්ධ කිරීම හෝ ගබඩාකර තබා ගැනීම .

පෝර හෝ රසායන පෝර නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.

හම් ගබඩාකර තබා ගැනීම.

උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් උම්බලකඩ ගබඩාකර තබා ගැනීම.

කුකුලන් 100 ට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යාම.

බැටලුවන්, එළුවන්, හෝ ඌරන් 10 ට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යාම.

රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යාම.

පුවක් සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.

කරවල, ලුනු මාලු හෝ ජාඩි හොණ්ඩර 3 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම .

මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම.

අඟුරු සඳහා දැව හෝ පොල්කටු දැවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම.

සිමෙන්ති හොණ්ඩර 25 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.

දුම්කොළ සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

සත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම.

පුන්නක්කු ටොන් 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

සත්ව ආහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම.

සතුන්ගේ මාංශාවශේෂ හෝ ලේ පැසවීම.

සබන් නිෂ්පාදනය කිරීම.

සව් හෝ මයියොක්කා කැට (ටැපියෝකා) නිපදවීම.

ඇට කටු ගබඩා කිරීම සඳහා අංගයක් හෝ ගබඩාවක් හෝ පවත්වාගෙන යාම.

වරනක් පෙට්ටි සෑදීම.

අලුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම.

ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම.

ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.

මෙරට හෝ රට වේවැල් වලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කළ භාණ්ඩ ගබඩාකර තබා ගැනීම.

වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙනයාම.

කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කර තබා ගැනීම.

සිරප් හෝ පළතුරු බීම වර්ග සෑදීම.

රස කැවිලි වර්ග නිපදවීම.

පොල් ලෙලි හෝ දැව පල්කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යාම.

මේද නිපදවීම හෝ නිශ්කර්ශනය කිරීම.

දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීම.

දත් බුරුසු නිපදවීම.

රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම.

විනාකිරි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනිම.

ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.

හුණුගල් හෝ හුණු ගබඩාකර තබා ගැනීම.

පැණි නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.

පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

ලෑලි සකස් කිරීම හෝ ලෑලි පදම් කිරීම.

සෝඩා නිපදවීම.

කෙඳි සායම් කිරීම.

කොකෝවා හෝ වියළි පැපොල් කිරි ගබඩාකර තබා ගැනීම.

සම්භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.

පළතුරු, මාලු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීම.

කෝපි, ධාන්‍ය වර්ග, මාෂ භෝග, කුලු බඩු හෝ පිටි ඇඹරීම.

යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාෂ භෝග කෙටීම.

බේකින් පවුඩර් නිපදවීම.

මාජරින් නිපදවීම.

ගෑස් මැන්ටල් නිපදවීම.

ෂපාට් නිපදවීම.

ඉටි පන්දම් නිපදවීම.

කපුරු නිපදවීම.

ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ඉස්ටෙන්සිල් තීන්ත නිපදවීම.

රෙදි සෝදන නිල් නිපදවීම.

සායම් කුඩු නිපදවීම.

ලාකඩ නිපදවීම.

සුවඳ පුයර නිපදවීම.

පාසැල් රටහුණු නිපදවීම.

ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.

ටයර් හෝ ටියුබ් වල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙනයාම.

සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.

වැලි කඩදාසි නිපදවීම.

ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම.

පාසැල් ගල්ලෑලි නිපදවීම.

සෞඛ්‍ය තුවාකඩ නිපදවීම.

ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.

සෙල්ලම් බඩු නිපදවීම.

මුහුදු පාසි සකස් කිරීම හා ගබඩාකර තබා ගැනීම.

සීත කළ්‍මාලු හෝ මස් ගබඩාකර තබා ගැනීම.
කපාපු පොල් නිපදවීම.

ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම.

මැණික් ගල් කැපීම හා ඔප දැමීම.

දියහුණු, සුදු (වයිටින්) හුණු හෝ හිරිගල් නිපදවීම.

එන්සාල්, (කර්ද මුන්ගු) සකස් කිරීම හෝ වියලීම.

III වැනි කොටස

අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

තලාතු මිනිරන් සුද්ධ කිරීම.

රසායන ද්‍රව්‍ය පාවිච්චිකොට කුරුඳු (කර්දමුංගු) එන්සාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම.

ඩ්‍රයි ක්ලීනින් කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙනයාම.

රෙදි මුද්‍රණකරන හෝ සායම් දමන ආයතනයක් පවත්වාගෙන යාම.

විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙනයාම.

ශතල් හෝ සත්ව මේද නිපදවීම.

හුණු පිලිස්සීම, සකස් කිරීම, ගබඩාකිරීම හෝ හුණුගල් කැඩීම.

මැටි බඳුන් ඔප දැමීම.

ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙනයාම.

මෝර වරල් සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

බැටරි චාජ් කිරීම හෝ අලුත්වැඩියා කිරීම.

වෑල්ඩිං සඳහා ස්ථානයක් පවත්වාගෙනයාම.

මෝටර් වාහන සර්විස් කිරීම හෝ අලුත් වැඩියාකිරීම සඳහා වැඩ පළක් පවත්වාගෙනයාම.

බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙනයාම.

යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම.

වාත්තු මඩුවක් පවත්වාගෙනයාම.

බෙලෙක් වැඩපලක් පවත්වාගෙනයාම.

ගල් ඉස්මාරක නිපදවීම.

පැට්‍රෝල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම.

මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ආයතනයක් පවත්වාගෙන යාම.

පොලිස් හෝ ඉටි වර්ග නිපදවීම.

කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.

විෂබීජ නාශක ද්‍රව්‍ය නිපදවීම.

මදුරුකවා (කොයිල්ස්) නිපදවීම.

ලී දඹු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම.

රබර් ද්‍රාවක හෝ රබර් සිමෙන්ති නිෂ්පාදනය කිරීම.

ගල් තාර හෝ වෙනත් බිටුමන්මය නිෂ්පාදනය නිපදවීම.

වීදුරු භාණ්ඩ නිපදවීම.

වීදුරු කැඩපත් නිපදවීම.

යකඩ තහඩු ගැල්වනයිස් කිරීම.

පාස් සහ ඊයම් නිපදවීම.

ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම.

කටු කම්බි නිපදවීම.

කම්බි ඇණ නිපදවීම.

කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම.

බෙලෙක් බඳුන්, වාහෝ රීප්ප හෝ ගබඩා ටැන්කි නිපදවීම.

ජී. අයි. බාල්දි නිපදවීම.

වායු සම්පාය යන්ත්‍ර, ශීත කරණ හෝ අධි ශීත කරණ (ඩීප් ප්‍රීසර්) නිපදවීම.

සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම.

බ්‍රේක් ලයිනින් හෝ ක්ලච් ලයිනින් නිපදවීම.

යන්ත්‍රෝපකරණ නිපදවීම.

විදුලි භාණ්ඩ නිපදවීම.

රබර් කැවුනු රෙදි වර්ග නිපදවීම.

සංචායක බැටරි නිපදවීම.

වියළි කෝෂ බැටරි නිපදවීම.

ඊයම් බැටරි නැවත චාජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.

රන්කම් සුන්බුන් වලින් වටිනා ලෝහ නිර්කර්ශනය සඳහා ස්ථානයක් පවත්වාගෙනයාම.

ට්‍රැක්ටර් රථ එකලස් කිරීම.

රේඩියෝටර් නිපදවීම.

විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අලුත් වැඩියා කරන වැඩ පලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවීමේ වැඩ පලක් පවත්වාගෙනයාම.

10–745—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

## පල්ලේ පත්තු (කුරු. කෝ.) ගම් සභාව—රත්නපුර දිස්ත්‍රික්කය

ගෝ ඝාතක ආඥාපනත

මෙහි පහත උපලේඛණයේ නම් සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයෙහි මස් වෙළඳාම් කිරීමෙන් ගෝ ඝාතක ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා 1973 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලා අයදුම් පතක් මා වෙත ඉදිරිපත් කර තිබෙන බව ගෝ ඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 (2) වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ. මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන පල්ලේ පත්තු (කුරු. කෝ.) ගම් සභා සීමාව තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය එසේ විරුද්ධවන්නේ කුමන හේතුවක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම් දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත එවිය යුතු බැව් මෙයින් දනුම් දෙමි.

ඒ. වී. මාරඹේ,
පල්ලේ පත්තු (කුරු. කෝ.) ගම් සභාවේ සභාපති.

1973.10.08 වෙනි දින,
පල්ලේ පත්තු (කුරු. කෝ.) ගම් සභා කාර්යාලය,
ඇහැළියගොඩ.

උපලේඛනය

| අයදුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | ව්‍යාපාරයේ නම |
|---|---|---|
| ඒ. ඒස්. එම්. නලීම්, ගලගෙදර, භාදුක්ක | ... ගැටහැත්ත සතියේ වෙළඳ පොල පිහිටා ඇති පල්ලිය වත්ත නොහොත් උළුකඩේ වත්ත නැමති ඉඩමේ | ... හරක් මස් විකිණීම |

10–599.—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

## පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් (261 වෙනි අධිකාරය) පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වෙනි වගන්තිය ප්‍රකාර 1972 මාර්තු මස 10 වැනි දින අංක 15,0001 දරණ ගැසට් පත්‍රයේ පල කරන ලද සංශෝධිතයට දක්වන XVIII වැනි කාණ්ඩය පිළිගැනීමටත් එය ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමටත් ක්‍රියාත්මක කර ගැනීමටත් ආණමඩුව ගම්සභා විසින් මෙයින් යෝජනාකර සිටිනු ලැබේ යනුවෙන් තට්වැව ගම්සභා නියෝජිත ආර්. ඒ. ඒ. රණසිංහ මහතා කළ යෝජනාව වඩිගමන්ගාව ගම්සභා නියෝජිත ඇස්. ඇම්. පිනා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකච්ඡන්දයෙන් සභා සම්මත විය.

ඩබ්ලිව්. ඇම්. බණ්ඩාර,
ආණමඩුව ගම්සභාවේ සභාපති.

ආණමඩුව ගම්සභා කාර්යාලය,
ආණමඩුව.
1973. 07. 31

### අතුරු ව්‍යවස්ථාව

කලින් කල සංශෝධනය කරනු ලද පරිදි වූ 1953 අප්‍රේල් මස 10 වෙනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයෙහි පළකරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XVIII වැනි කොටසෙහි අන්තරාදායක අප්‍රසන්න ව්‍යාපාරවලට අදාල අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි මැඩිදූරටත් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි 1 වෙනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අළුත් ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

"1. මෙම අතුරු ව්‍යවස්ථාවල "අන්තරාදායක හෝ අප්‍රසන්න ව්‍යාපාර" යන්නෙන් මෙහි වූ උපලේඛනයෙහි අවස්ථෝචිත පරිදි I වැනි කොටසේ හෝ II වැනි කොටසේ හෝ III වැනි කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වේ" තවද,

(2) එම කොටසෙහි අවසානයට පහත දක්වෙන උපලේඛනය අන්තර්ගත කිරීමෙන් :—

### උපලේඛනය
### I වෙනි කොටස

අන්තරාදායක ව්‍යාපාර

කබොක් බොරළු හෝ කළුගල් කැණීම.

කබොක් බොරළු හෝ කළුගල් ගබඩා කිරීම.

සිසිල් බීම නිෂ්පාදනය.

ග්‍රෝස් 1 ට වැඩි ප්‍රමාණයට සිසිල් බීම ගබඩා කර තබාගැනීම.

අයිස් නිපදවීම.

කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එළවළු තෙල් නිශ්කර්ශනය

ගැලුම් 50 ට වැඩි ප්‍රමාණයක පොල් තෙල් ගබඩාකර තබා ගැනීම.

පොල් තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක් ගැලුම් 12 වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

ගිනිපෙට්ටි නිශ්පාදනය

ග්‍රෝස් 10 ට වැඩි ප්‍රමාණයක ගිනිපෙට්ටි ගබඩාකර තබා ගැනීම.

ඉඹුල් පුලුන් හෝ කපු පුලුන් ගබඩා කර තබා ගැනීම

කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.

මැතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම.

තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

පිදුරු ගබඩාකර තබා ගැනීම.

පාවිච්චිකළ ඇඳුම් ගබඩාකර තබා ගැනීම.

කුලියට දීමට ලාම්පු ගබඩාකර තබා ගැනීම.

ධාන්‍ය හෝ මාංශ භෝග වර්ග හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත් වැඩියා කිරීම

යන්ත්‍රෝපකරණ පාවිච්චිකරන ලී ඉරුම් මෝලක් පවත්වා ගෙන යාම.

අතින් ලී ඉරුම් වළක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යාම.

දව ගබඩාවක් පවත්වාගෙන යාම.

හිරිගල් හෝ හුණුගල් හෑරීම.

දර ගබඩාවක් පවත්වාගෙන යාම.

යන්ත්‍රෝපකරණ පාවිච්චිකරණ කම්හලක් පවත්වා ගෙන යාම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකෙරෙන කම්හලක් පවත්වා ගෙන යාම

තොග වශයෙන් විකිණීම සඳහා පිටි ලුණු හෝ සීනි හොණ්ඩර 15 ට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩා කර තබා ගැනීම, බයිසිකල් හෝ මෝටර් සයිකල් අළුත්වැඩියා කිරීම සඳහා වැඩ්පළක් පවත්වා ගෙන යාම.

අළුත් හෝ පාවිච්චි කරන ලද ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

පොල් කටු ගබඩා කර තබා ගැනීම.

ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොණ්ඩර 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි හෝ ගබඩා කර තබා ගැනීම.

විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටිං) සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.

අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් ක්‍රමයකින් නූල් කැටීම හෝ විවීම.

සිල්ක් හා කෘත්‍රිම රෙදි විවීම හා විසිතුරු කිරීම.

අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් ක්‍රමයකින් රෙදි නිපදවීම.

මැසූ ඇඳුම් නිෂ්පාදනය.

මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.

### II වැනි කොටස

අප්‍රසන්න ව්‍යාපාර

මිණිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

පෝර හෝ රසායනික පෝර නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.

හම් ගබඩා කර තබා ගැනීම.

උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් උම්බලකඩ ගබඩා කර තබා ගැනීම.

කුකුළන් 100 ට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුළු පට්ටියක් පවත්වාගෙන යාම.

බැටළුවන්, එළුවන් හෝ ඌරන් දහයකට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යාම.

රබර් නිෂ්පාදනය හෝ ගබඩා කර තබා ගැනීම.

පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යාම.

පුවක් සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුළු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.

කරවල ලුණු මාළු හෝ ජාඩි හොණ්ඩර 3 ට (3) වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

අඟුරු සඳහා දැව හෝ පොල්කටු දැමීම හෝ අඟුරු ගබඩා කර තබා ගැනීම.

සිමෙන්ති හොණ්ඩර 25 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.

දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

සත්වාහාර ගබඩාවක් පවත්වාගෙන යාම.

පුන්නක්කු ටොන් 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

සත්වාහාර කුකුල් කෑම නිෂ්පාදනය කිරීම.

සතුන්ගේ මාංශාවශේෂ හෝ ලේ පැසවීම.

සබන් නිෂ්පාදනය කිරීම.

සව් හෝ මඤ්ඤොක්කා කැට (ටැපියෝකා) නිපදවීම.

ඇටකටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් හෝ පවත්වාගෙන යාම.

ටිරන්ක් පෙට්ටි සෑදීම.

අළුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම.

ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.

ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

මෙරට හෝ රට වේවැල් වලින් භාණ්ඩ සෑදීම හෝ ඒවායින් කළ භාණ්ඩ ගබඩා කර තබා ගැනීම.

වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.

කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩාකර තබාගැනීම.

සිරප් හෝ පළතුරු බීම වර්ග සෑදීම.

රසකැවිලි වර්ග නිපදවීම.

පොල් ලෙලි හෝ දැව පල් කිරීම සඳහා කොටුවක් පවත්වා ගෙන යාම.

මේද නිපදවීම හෝ නිෂ්කර්ශණය කිරීම.

දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීම.

දත් බුරුසු නිපදවීම.

රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම.

විනාකිරි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

හුණුගල් හෝ හුණු ගබඩා කර තබා ගැනීම.

පැණි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

පින්තාරු, තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

ලැලි සකස් කිරීම හෝ ලැලි පදම් කිරීම.

සෝඩා නිපදවීම.

කෙඳි සායම් කිරීම.

කොකෝවා හෝ වියළි පැපොල් කිරි ගබඩා කර තබා ගැනීම.

සම්භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යාම.

පළතුරු, මාළු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීම,

කෝපි, ධාන්‍ය වර්ග, මාශභෝග, කුළු බඩු ටින්වල ඇසිරීම.

යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාශභෝග කෙටීම.

බේකිං පවුඩර් නිපදවීම.

මාජරින් නිපදවීම,

ගෑස් මැන්ටල් නිපදවීම.

පොටි නිපදවීම.

ඉටිපන්දම් නිපදවීම.

කපුරු නිපදවීම.

ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.

රෙදි සෝදන නිල් නිපදවීම.

සායම් කුඩු නිපදවීම.

ලාකඩ නිපදවීම.

සුවඳ පුයර නිපදවීම.

පාසැල් රටහුණු නිපදවීම.

ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වා ගෙන යාම.

ටයර් හෝ ටියුබ් වෝල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වා ගෙන යාම.

සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.

වැලි කඩදාසි නිපදවීම.

ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම.

පාසැල් ගල්ලෑලි නිපදවීම.

සෞඛ්‍ය තුවාකඩ නිපදවීම.

ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.

සෙල්ලම් බඩු නිපදවීම.

මුහුදු පාසි සකස් කිරීම හා ගබඩා කර තබා ගැනීම.

ශීත කළ මස් හෝ මාලු ගබඩා කර තබා ගැනීම.

කපාපු පොල් නිපදවීම.

ඡායාරූප ශාලාවක් පවත්වා ගෙන යාම.

මැණික් ගල් කැපීම හා ඔප දැමීම.

දිය හුණු සුදු (වයිටිං) හුණු හෝ ගිරිගල් නිපදවීම,

එන්සාල් (කර්දමුංගු) නිපදවීම හෝ වේලීම,

## III වෙනි කොටස

### අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

තලාතු මිණිරන් නිපදවීම.

රසායන ද්‍රව්‍ය පාවිච්චිකොට කුරුඳු (කරදමුංගු) එන්සාල් හෝ කෙඳි වර්ග නිපදවීම.

ඩ්රයි ක්ලීනිං කරන ස්ථානයක් හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම.

රෙදි මුද්‍රණය කරන සථානයක් හෝ සායම් දමන ආයතනයක් පවත්වාගෙන යාම.

විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම.

තෙල් හෝ සත්ව මේද පෑසවීම.

හුණු පිලිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණු ගල් කැඩීම,

මැටි බඳුන් ඔප දැමීම.

ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වා ගෙන යාම,

මෝර වරල් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම. හොණ්ඩර 5 ට වැඩියෙන් තේ ගබඩා කර තබා ගැනීම,

බැටරි චාජ් කිරීම හෝ අලුත් වැඩියා කිරීම.

වැල්ඩිං සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.

මෝටර් වාහන සර්විස් කිරීම හෝ අළුත් මැඩියා කිරීම් වැඩපොළක් පවත්වාගෙන යාම.

බෝට්ටු සෑදීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.

යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම.

වාත්තු මඩුවක් පවත්වාගෙන යාම.

බෙලෙක් වැඩපොලක් පවත්වාගෙන යාම.

ගල් ස්මාරක නිපදවීම.

පැට්රෝල්, ඩීසල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම.

පැට්රෝල් නිකුත් කරන සථානයක් පවත්වාගෙන යාම,

මෝටර් වාහන සඳහා බොඩි නිපදවන සථානයක් පවත්වාගෙන යාම.

පොලිෂ් ඉටි වර්ග නිපදවීම.

කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

විෂබීජ නාශක ද්‍රව්‍ය නිපදවීම.

මදුරු කව (කොයිල්ස්) නිපදවීම.

ලී දඩු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම.

රබර් ද්‍රාවක හෝ රබර් සිමෙන්ති නිෂ්පාදනය.

ගල්තාර හෝ බිටුමත්මය නිෂ්පැදනය නිපදවීම,

වීදුරු භාණ්ඩ නිපදවීම.

වීදුරු කැඩපත් නිපදවීම.

යකඩ තහඩු ගැල්වනයිස් කිරීම.

පාස්සන ඊයම් නිපදවීම.

ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම.

කටු කම්බි නිපදවීම.

කම්බි ඇණ නිපදවීම.

කාබන් කඩදාසි හෝ යතුරු ලියනපටි (රිබන්) නිපදවීම.

බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ (ගබඩා ටැංකි) නිපදවීම්, ජී. අයි. බාල්දි නිපදවීම.

වායු සමන යන්ත්‍ර, ශීත කරණ හෝ අධි ශීත කරණ (ඩීප් ෆ්‍රිසර්) නිපදවීම සර්විස් කිරීම හෝ අළුත් වැඩියා කිරීම.

බ්‍රේක් ලයිනිං හෝ කල්ච් ලයිනිං නිපදවීම.

යන්ත්‍රෝපකරණ නිපදවීම.

විදුලි භාණ්ඩ නිපදවීම.

රබර් කැවුනු කෙඳි වර්ග නිපදවීම.

සංචායක බැටරි නිපදවීම.

වියළි කෝෂ බැටරි නිපදවීම.

ඊයම් බැටරි නැවත චාර්ජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.

රන් කම් සුන්බුන් වලින් වටිනා ලෝහ නිෂ්කර්ෂණය කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.

ට්‍රැක්ටර් රථ එකලස් කිරීම.

රේඩියේටර් නිපදවීම.

විදුලි කර්මාන්ත වැඩපළක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරණ ස්ථානයක්, ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩපළක් පවත්වාගෙන යාම.

10-621—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. **සියළුම දයක මුදල් කොළඹ, මහලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

**1973**

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ඔක්තෝබර් | ... | 05.10.73 | සිකුරාද | ... | 28.09.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 12.10.73 | සිකුරාද | ... | 05.10.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 19.10.73 | සිකුරාද | ... | 12.10.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 26.10.73 | සිකුරාද | ... | 19.10.73 | සිකුරාද | දහවල් | 12.00 |
| නොවැම්බර් | ... | 02.11.73 | සිකුරාද | ... | 26.10.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 09.11.73 | සිකුරාද | ... | 02.11.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 16.11.73 | සිකුරාද | ... | 09.11.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 23.11.73 | සිකුරාද | ... | 16.11.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 30.11.73 | සිකුරාද | ... | 23.11.73 | සිකුරාද | දහවල් | 12.00 |
| දෙසැම්බර් | ... | 07.12.73 | සිකුරාද | ... | 30.11.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 14.12.73 | සිකුරාද | ... | 07.12.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 21.12.73 | සිකුරාද | ... | 14.12.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 28.12.73 | සිකුරාද | ... | 21.12.73 | සිකුරාද | දහවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.